# බළන්ගොඩ නගර සභාව

## 2021-08-10 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.08.10**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්.ජ්.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රි | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රි | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රි | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 16. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්.එච්.ඒ.කරුණාරත්න මිය

**01. පසුගිය මහ සභා වාර්තාව, හා විශේෂ සභාවේ සභා වාර්තා සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා, මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2021-07-13 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2021-07-26 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා විසින් 2021-07-13 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2021-07-26 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අතර, සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2021-07-13 දින පැවති මහ සභාවේ සභා වාර්තාව හා 2021-07-26 දින පැවති විශේෂ මහ සභා වාර්තාව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ගරු සභාපතිතුමා විසින් නිවේදන වාරය ආරම්භ කරමින් ප්‍රකාශ කළේ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රටේ තත්ත්වය දරුණු වී ඇති අතර, ඉන්දියාව හා චීනය යන රටවල් සමඟ සැසඳූ විට දෛනික ආසාධිතයන් ප්‍රමාණය හා දෛනික මරණ සංඛ්‍යාව සෞඛ්‍ය අංශවලට දරා ගත නොහැකි මට්ටමකට වැඩිවෙමින් පවතින බවයි. මේ සඳහා ප්‍රධානතම හේතුව වන්නේ පොදු ජනතාව අනවශ්‍ය නිදහසක් භුක්ති විඳිමින් තමන්ගේ ආරක්ෂාව තමන්වත් සලසා නොගෙන කටයුතු කිරීම වන බැවින් අප විසින් කළ යුත්තේ පවුලේ හිතවතුන් පමණක් නොව සියලුම පුරවැසියන් දැනුවත් කර ආරක්ෂා කර ගැනීම වන අතර, අප සියලු දෙනා මේ බව දැඩිව සිතේ තබාගෙන සමාජය වෙනුවෙන් අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බව වැඩිදුරටත් පැවසීය.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- බළන්ගොඩ, කල්තොට පාර, 53/3 ලිපිනයේ පදිංචි ප්‍රේමවර්ධන අම්පිටියාවත්ත යන අය විසින් බස් නැවතුම්පොළ හා දොරවෙල ඔය අතර කොටස මාස 08ක් 10 ක් පමණ කාලයකින් ශුද්ධ පවිත්‍ර කර නොමැති බවත්, අධික දුර්ගන්ධයක් පවතින අතර, නගර සභාවේ වගකිව යුතු නිළධාරින් මේ

සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් පවසමින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

මෙහි දී අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම ඉඩම් කොටස නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම් කොටසක් බැවින් සංවර්ධනය වී නොමැති බවයි. මේ සම්බන්ධව තමන් විසින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාව දැනුවත් කළ අවස්ථාවේ එතුමා නාගරික සංවර්ධන අධිකාරියට ගොස් අදාල නිළධාරීන් මුණ ගැසී අවශ්‍ය කටයුතු සිදු කළ අතර, බළන්ගොඩ පුද්ගලයෙක් පාර්ලිමේන්තුවට තේරී පත්ව බළන්ගොඩ ගැන කතා කළ එම අවස්ථාව තමන්ගේ දේශපාලන ජීවිතයේ ලැබුණු සංවේදීම අවස්ථාවක් වූ බව ද කොරෝනා වසංගතය හේතුවෙන් රට වැසූ කාල සීමාව තුළ නගරයේ කාණු ශුද්ධ පවිත්‍ර කිරීම සිදු කළ නමුත් ඒ අතරතුර රට නැවත විවෘත වූ බැවින් දෛනික කසළ රාජකාරීවල යෙදීමට සිදු වූ බව ද මෙම ලිපියෙහි සඳහන් කාරණය ගැන තමන් දැනුවත් වූයේ අද බව ද ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් පසුගිය සභා වාරයක දී තමන් කාණු සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කළ බව ද පාරේ යාමට පවා නොහැකි දුර්ගන්ධයක් පවතින බව ද පවසන ලදී.

මෙහි දී අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පැවසූවේ කාණු සඳහා ෆිල්ටර් පද්ධතියක් යෙදීමට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා අදහස් කර ඇති බවයි.

මේ සම්බන්ධව පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පැවසූවේ අදාල ව්‍යාපෘති යෝජනා සියල්ල රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අප විසින් ලබා දී ඇති අතර, එම යෝජනා සඳහා කඩිනම් පියවර ගැනීමට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා කටයුතු කරන බව තමන්ට ප්‍රකාශ කළ බවයි.

ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවට යාබදව පවතින පොලීසියේ වැසිකිළිය හේතුවෙන් දුර්ගන්ධයක් පවතින බව පැවසීය.

මේ සම්බන්ධව මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාව දැනුවත් කර, පරීක්ෂා කර බලා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා පවසන ලදී.

එමෙන්ම ලිපිය මඟින් දන්වා ඇති කාණු කොටස සම්බන්ධයෙන්ද පරීක්ෂා කර බලා සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට තීරණය විය.

**පෙ.ව 10.17 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

- බළන්ගොඩ නගර සභාව විසින් තමන්ගේ ඉඩමට යාබද ඉඩමේ කොට්ට ගසක් කපා ඉඩම අවහිර කර ඇති බවත්, පොල් ගසකට හා කෙසෙල් වගාවට හානි සිදු වී ඇති අතර බෝක්කුව අවහිර වී ඇති බවත් පවසා එම කොට්ට ගස ඉඩමෙන් ඉවත් කර දෙන ලෙස ඉල්ලමින් බළන්ගොඩ, ඕලුගංතොට, කරදියමුල්ල පාර, අංක 32 ලිපිනයේ පදිංචි කේ. ඩබ්. පී. එස්. ධම්මිකා යන අය එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මෙහි දී අදහස් දක්වන ලද ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා, මෙම කොට්ට ගස ඉවත් කිරීම සඳහා ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා හා අනෙකුත් කොට්ඨාස මන්ත්‍රීවරුන් මැදිහත් වූ අතර, ඔවුන්ට පැවති ලොකුම අවදානම ඉවත් කර දුන් පසුව නගර සභාව මඟින් හැමදේම කරගන්න කටයුතු කිරීම අසාධාරණ බව ද ඔවුන්ට ද යම් දායකත්වයක් ලබා දීමට වගකීමක් පවතින බව ද පැවසීය.

  ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා පැවසූවේ මොවුන්ට ඉඩමේ අයිතිය පිළිබඳ ප්‍රශ්නයක් පවතින අතර, නගර සභාවට චෝදනා කිරීම වැරදි බවයි.

  මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, කාලයක් තිස්සේ කොට්ට ගස කපා ඉවත් කර දෙන ලෙස ඉල්ලීම් පැවති බව ද ඒ අනුව කොට්ඨාස මන්ත්‍රීවරුන්ගේ මැදිහත් වීමෙන් එම අවදානම ඉවත් කර දුන් බව ද මින්පසු ගසක් ඉවත් කිරීමේ කාර්යයේ දී මේ සම්බන්ධව වන කිසිදු දෙයකට නැවත කටයුතු නොකරන බවට ලිඛිතව කැමැත්ත ලබා ගැනීම කළ යුතු බව ද පැවසීය.

  එමෙන්ම මෙම කොට්ට ගස පරීක්ෂා කර බලා කොටස් වශයෙන් කපා ඉවත් කිරීමට තීරණය විය.

**පෙ.ව 10.27 ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

- බළන්ගොඩ, කොටුව පෙදෙසෙහි අනාරක්ෂිතව පැවති කාණු පද්ධතිය පිළිසකර කර ගැනීමට ශක්ති ප්‍රමාණයෙන්, අවස්ථානුකූලව ප්‍රතිචාර දැක්වීම පිළිබඳව ගරු සභාපතිතුමා, නාගරික මන්ත්‍රීතුමන්ලා හා කාර්ය මණ්ඩලය දක්වන ලද කැපවීම වෙනුවෙන් ප්‍රදේශවාසීන්ගේ ස්තුතිය ප්‍රකාශ කරමින් බළන්ගොඩ, කොටුගොඩැල්ල පාර, කොටුව පෙදෙස, අංක 11/4/ A ලිපිනයේ ගාමිණී අනුර වීරසේකර යන අය විසින් එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

- අසනීප තත්ත්වයක් හේතුවෙන් 2021-08-10 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත්, ඉල්ලා ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා එවා ඇති ලිපිය ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම**

04:01:01 වීථි පහන් සඳහා බල්බ් හා හෝල්ඩර් මිලදී ගැනීම සඳහා වූ මිල ගණන් විවෘත කිරීම

මිල ගණන් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ශක්ති, Anton, Orange, Lotus හා Asian යන ආයතන 05 න් මිල ගණන් ඉදිරිපත් වූ අතර, අවම මිල ගණන ඉදිරිපත් කළ පහත ආයතනයන්ගෙන් බල්බ් හා හෝල්ඩර් මිල දී ගැනීම සඳහා ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා ස්ථිර කරන ලදී.

| **ආයතනය** | **වර්ගය** | **ප්‍රමාණය** | **ඒකක මුදල** |
|---|---|---|---|
| Orange | CFL (30 W) | 250 | රු. 791.24 |
| Lotus | සෙරමික් හෝල්ඩර් | 100 | රු. 165.00 |
| Lotus | LED (12 W) | 50 | රු. 420.00 |
| Asian/ ශක්ති | Holder Polycrome | 30 | රු. 100.00 |

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

04:01:02 ZA 5039 අංක දරණ JCB යන්ත්‍රයට ඉදිරිපස හා පිටුපස සඳහා අවශ්‍ය ටයර් හා ටියුබ් ලබා ගැනීම සඳහා වූ මිල ගණන් විවෘත කිරීම

මිල ගණන් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාළ මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව Wheel Service Center, Woodland Tyre Service, Perera Tyre Service (PVT) LTD, Crown Tyre (PVT) LTD හා සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව යන ආයතන 05 න් මිල ගණන් ඉදිරිපත් වූ අතර, අවම මිල ගණන ඉදිරිපත් කළ Perera Tyre Service (PVT) LTD

ආයතනයෙන් පහත පරිදි ටයර් හා ටියුබ් මිල දී ගැනීම සඳහා ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදී.

| වර්ගය | ඒකක මිල ( වැට් සමඟ) | ප්‍රමාණය | මුලු මුදල |
|---|---|---|---|
| 14.17.5 Tyre ( Gri 14 PR Sri lanka) | 51,400.00 | 02 | රු.102,800.00 |
| 14.17*5 Tube (Korea) | 6,320.00 | 02 | රු. 12,640.00 |
| 19.5.24 Tyre ( Gri 12 PR Sri lanka) | 93,450.00 | 02 | රු.186,900.00 |

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05. කල් දී ඇති ප්‍රශ්න**

ගරු නාගරික මන්ත්‍රීවරුන් වන නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා හා ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති කල් දී ඇති ප්‍රශ්න සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**05:01 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

05:01:01 පසුගිය සභා වාරයේ දී ලිඛිතව ඉදිරිපත් වූ පහත සඳහන් ඉල්ලීම්වලට මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

I. රාස්සගල පාර, අංක 90/10 ඒ, බළන්ගොඩ ලිපිනයෙහි පදිංචි එන්. එල්. චමින්ද අරුණ ශාන්ත යන අය විසින් ඉදිරිපත් කළ වැසි ජලය බැස යාමට සුදුසු ඉඩක් ලබා ගැනීම

නීලිකා යන අයගේ නිවස පිටුපස ඉදි කර ඇති අනවසර බැම්ම හේතුවෙන් ජලය බැස යන ආර වැසී ඇති බවත්, ග්‍රාම නිලධාරීතුමාගේ කැඩැස්තර සිතියම පරීක්ෂා කර ෆයිරුක් මහතා, එන්. එල්. චමින්ද අරුණ ශාන්ත මහතා සහ නීලිකා මහත්මිය යන අයගේ එකඟතාවය මත කාණුවක් ඉදි කර මෙම ගැටලුව විසඳා ගත හැකි බවත් පවසන ලදී.

එමෙන්ම ඉදිකර ඇති බැම්ම අනවසර ඉදිකිරීමක් බැවින් යම් කිසි දවසක එම බැම්ම ඉවත් කිරීමට සිදු වුවහොත් ඉවත් කළ යුතු බව දන්වා බැමි ඉදි කළ අය වෙත ලිඛිතව ලිපි මඟින් දැනුම් දෙන ලෙස ගරු සභාපතිතුමා වැඩිදුරටත් පවසන ලදී.

II. රාස්සගල පාර, පල්ලෙවෙල, 140/29 බී, ලිපිනයෙහි පදිංචි සමන්ත ප්‍රියලාල් ඉන්ද්‍රපාල යන අය ඉදිරිපත් කළ මාර්ගයේ වැසි ජල කාණු පද්ධතියේ ගැටළුව විසඳීම

විශාල ජල කඳක් ගලා ඒම හේතුවෙන් පවතින බෝක්කු හා කාණු පද්ධතිය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් මෙම ගැටළුව පැන නැඟී ඇති අතර, ඉඩමේ ඉහළ කොටසින් නව බෝක්කුවක් හා කාණු පද්ධතියක් ඉදි කිරීම මඟින් මෙම ගැටළුව නිරාකරණය කර ගත හැක. ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ කළ ලිපියක් අදාල ඉඩම් හිමියාගෙන් ලබා ගැනීමෙන් අනතුරුව කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කර, කර්මාන්ත කමිටුව හරහා නඩත්තු යටතේ සිදු කිරීමට හැකි බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**පෙ.ව 11.11 ට පමණ ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**05:02 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

05:02:01 නව මහජන පොළ භූමියේ බුදු මැදුර ඉදිරිපිට තිබූ කුකුල් මස් වෙළෙඳසැල් දෙක සඳහා දී තිබූ කාල සීමාව අවසන් වීමෙන් පසුව තවදුරටත් මාසයක කාලයක් මවිසින් සහන කාලයක් සේ ලබා දුන් අතර, එයින් එක් ව්‍යාපාරයක් දැනටමත් අයින් කරගෙන ඇති නමුත් අනෙක් ව්‍යාපාරික මහතා නීතිය පිළිනොපදින අයෙකු සේ දිස්වේ. ගරුතර ස්වාමීන් වහන්සේලා මගෙන් නගරයේ මන්ත්‍රීවරයා හැටියට මේ ගැන ප්‍රශ්න කරන අතර, මේ සඳහා නගර සභාව හැටියට ගත් හා ගන්නා පියවර කුමක් ද?

මෙම කුකුල් මස් වෙළෙඳ සැල සඳහා ඉදිරියේදී නගරයේ විශාල විරෝධතාවයක් එල්ල විය හැකි බවට වෙළෙඳසැල් හිමියා දැනුවත් කර නගර සභාව විසින් මාසයක සහන කාලයක් ලබා දුන් බැවින් ඒ බව ද සලකා බලා මෙම වෙළඳසැල ඉවත් කර ගන්නා ලෙස ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා එම ස්ථානයට ගොස් සාකච්ඡා කරන ලෙස ගරු සභාපතිතුමා පවසන ලදී.

05:02:02 නගර සභාවේ තිබූ "බුදු පිළිමය" වහලය පොල්ගස නිසා කැඩී බිඳී තිබූ බව දර්ශණය විය. දැන් එය ගලවා ඇති අතර නැවතත් තෝරාගත් ස්ථානයේ ස්ථාපනය නොකරන්නේ මන්ද?

බුදු මැදුර අලුතින් ස්ථාපිත කිරීමට ඇස්තමේන්තු සකස් කළ නමුත් ප්‍රාග්ධන වියදම් කළ නොහැකි බැවින් ඉටු කළ නොහැකි වු බව ද පැවති බුදු පිළිමය අලුත්වැඩියා කිරීමට යවා ඇති බව ද පවසන ලදී.

**පෙ.ව 11.25 ට පමණ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

06:01:01 ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| **ද්‍රව්‍ය** | **ප්‍රමාණය** |
|---|---|
| මුද්‍රිත ලියුම් කවර | 5000 |
| 12.5W Bulb | 20 |
| Ballpoint Pen (Blue) | 500 |
| ඉදල් | 100 |
| OE Can | 10 |
| File Tag | 1000 |
| Mini Soap | 500 |
| පාට A4 තැඹිලි | බන්ඩල් 01 |
| Sanitizer | කෑන් 10 |
| බිම් කට්ටි අයදුම්පත් | 1000 |
| ගොඩනැගිලි අයදුම්පත් | 1000 |
| මකන | 20 |
| File (කොළ පාට) | 100 |
| ඉන්ධන අයදුම්පත් | 1000 |
| A 3 බන්ඩල් | 03 |
| ATD අයදුම්පත් | 1000 |
| ස්ටෙප්ලර් කටු | පැකට් 50 |
| පේපර් ක්ලිප් | පැකට් 50 |
| බලපත්‍ර කාලය දීර්ඝ කිරීමේ අයදුම්පත් | 500 |
| අනුකූලතා සහතික | 500 |
| ෆයිනෝල් ලීටර් 04 කෑන් | 50 |
| හාෆික් 500ml කෑන් | 100 |
| සබන් කෑලි | 500 |
| කොසු | 24 |
| ඉදල් | 40 |
| වැසිකිලි පිරිසිදු කරන බ්‍රෂ් | 12 |
| කාණු බ්‍රෂ් | 24 |
| මොබ් | 12 |
| වයිෆර් | 10 |
| බෝගන්විලා සඳහා නිල් කැට | කි. ග්‍රෑ 50 |
| බවර් 21 මල් පොහොර | කි. ග්‍රෑ 10 |
| ග්ලවුස් ජෝඩු | 100 |
| බූට්ස් ජෝඩු | 05 |
| එතනෝල් ලීටර් | 25 |
| සෝඩියම් හයිපක්ලෝරීන් දියර | ලීටර 250 |
| ගාබේජ් බෑග් | 1100 |
| ටෙන්ඩ් රෙදි (ටාපෝලින් රෝල්) | 01 |
| වල් නාශක (කනත්ත සඳහා) | 10 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06෴01෴02 පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මඟින් අයාලේ යන සුනඛයින් එන්නත් කිරීමේ කටයුතු සම්බන්ධයෙන් ලබා දෙන ලද උපදෙස් ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06፥01፥03 2021 අගෝස්තු මාසය සඳහා කාර්යසාධන ණය රු. 800,000.00 කට යටත්ව ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:04 ගිනි නිවීමේ උපකරණ කල් ඉකුත් වීමට ආසන්නව ඇති බැවින් නැවත පිරවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ලබන වර්ෂයට වෙළඳ බලපත්‍ර ලබා දීමේ දී වෙළෙඳ ස්ථානවල ගිනි නිවීමේ උපකරණ ස්ථාපිත කර ඇත්දැයි පරීක්ෂා කරන ලෙස පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06፥01፥05 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

i. පොදු වෙළෙඳසැල අංක 03 හා 17 කඩකාමර ටෙන්ඩර් කිරීමට අදාල පුවත්පත් දැන්වීම් පළ කිරීම (දිනමිණ හා තිණකරන් පුවත්පත - 2021 මැයි 21 හා 2021 ජූලි 02 පළ කරන ලද දැන්වීම්) වෙනුවෙන් ලේක්හවුස් ආයතනය වෙත රුපියල් 144,612.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ii. සභාව තුල වාහන තක්සේරු කිරීම සිදු කරන ලද රත්නපුර මෝටර් රථ ප්‍රවාහන කාර්යාලයේ මෝටර් රථ පරීක්ෂක ඩී.කේ. නුවන් ඩිල්හාන් මහතාට ඒ සඳහා රු. 20,750.00 ක මුදලක් ගෙවීමට සභා අනුමැතිය ලබා ගැනීම (රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2015 හි 7 වගන්තිය යටතේ ගෙවීම් සිදු කිරීම)

iii. RD 8000 අංක දරණ ට්‍රැක්ටර් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් රිෂානා සර්විස් ආයතනය වෙත රු.23,568.00ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

iv. 56-1906 අංක දරණ කෘෘ කැබ් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ. ඉංජිනියරින් ආයතනය වෙත රු.12,840.00ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

v. 2021 මැයි, ජූනි, ජූලි මාස සඳහා විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවීම වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට රු. 36,598.80 ක මුදල ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

vi. ND 5124 අංක දරණ වෑන් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ. ඉංජිනියරින් ආයතනය වෙත රු.15,840.00ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

vii. PF-4006 අංක දරණ කැබ් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ. ඉංජිනියරින් ආයතනය වෙත රු.13,650.00ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:06 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වවුචර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2021-07-08 | සුසාන භූමි නඩත්තුකරු දීමනා ගෙවීම | 26-3 | 066638 | 20,000.00 |
| 2021-07-08 | දෛනික වැටුප් | 26-6, 26-7, 26-9 26-11 | 066638 | 183,379.37 |
| 2021-07-16 | බී.විනෝදනී ප්‍රේමිකා - 2021-07-01 සිට 2021-07-15 දක්වා කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගෙවීම | 49 | 066682 | 320,025.00 |
| 2021-07-19 | පෝස්ට් මාස්ටර් ජනරාල් | 50 | 066683 | 10,000.00 |
| 2021-07-22 | වැටුප් අත්තිකාරම් (කර්මාන්ත අංශය) | 66 | 066727 | 34,000.00 |
| 2021-07-26 | බී.කේ.ජේ.එස්. අමරදාස මයා,- ඉන්ධන බිල්පත් ගෙවීම | 67 | 066728 | 158,228.00 |
| 2021-07-27 | සී/ස ඉඹුල්පේ වි.සේ.ස.සමිතිය - ඉන්ධන බිල්පත් පියවීම | 70-1 සිට 70- 4 දක්වා | 066731 | 130,596.85 |
| 2021-07-27 | ලංකා විදුලි බල මණ්ඩලය - කාර්යාලය, නගර සභා යාබද ගොඩනැගිල්ල | 71-5 | 066732 | 29,623.45 |
| 2021-07-27 | ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් - 2021 ජූනි, ජූලි මාසවල දුරකතන බිල්පත් පියවීම (කාර්යාලය අන්තර්ජාල බිල්) | 72-2 | 066733 | 14,766.80 |
| 2021-07-27 | ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් - 2021 මැයි, ජූනි මාසවල ක්ලවුඩ් බිල්පත් පියවීම (කාර්යාලය) | 72-4 | 066733 | 22,680.00 |
| 2021-08-02 | බී.විනෝදනී ප්‍රේමිකා - 2021-07-16 සිට 2021-07-31 දක්වා කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගෙවීම | 10 | 066744 | 299,021.73 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:07 2021 සැප්තැම්බර් මස සභාවේ ගරු සභිකරුන්ගේ දීමනාව ලෙස රු.270,000.00 ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:08 2021-08-10 දින සිට 2021-09-07 දක්වා සෞඛ්‍ය සේවා සඳහා වියදම් ඇස්තමේන්තුව වන රු. 64,520.00 ක මුදල සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:09 2021 සැප්තැම්බර් මස සභාවේ නිළධාරීන්ගේ අතිකාල හා ගමන් වියදම් ඇස්තමේන්තුව සඳහා රු300,000.00 ක මුදලක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:10 2021-08-10 දින සිට 2021 සැප්තැම්බර් මස සභාව පැවත්වෙන දින දක්වා සභාවේ සංග්‍රහ වියදම් ලෙස රු.50,000.00 ක මුදලක් වියදම් දැරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:11 2021-08-10 දින සිට 2021 සැප්තැම්බර් මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ හදිසි වාහන අලුත්වැඩියා කටයුතු සඳහා රු.300,000.00 මුදලක් වියදම් කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:12 2021-08-10 දින සිට 2021 සැප්තැම්බර් මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ හදිසි යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කටයුතු සඳහා රු.75,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:13 2021 අගෝස්තු මස ගෙවිය යුතු දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් බස්නැවතුම්පල සහිත වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබා ගත් ණය වාරිකය ලෙස රු.769,680.36 මුදලක් ද, වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් ලබා ගත් ණය වාරිකය ලෙස රු.202,918.84 ක මුදලක් ගෙවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:14 බළන්ගොඩ මූලික රෝහල අසල ඇති බස්නැවතුම්පළ මගී ආවරණය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:15 බළන්ගොඩ නගර සභා කාර්යාලයේ තීන්ත ආලේප කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පැවසුවේ බළන්ගොඩ නගර සභා පරිශ්‍රයේ පවතින සියලුම ගොඩනැගිලිවල තීන්ත ආලේප කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:16 වැවවත්ත පෙර පාසලෙහි තීන්ත ආලේප කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

| **විස්තරය** | **ප්‍රමාණය** |
|---|---|
| නිල් පාට තීන්ත | ලීටර 01 |
| රතු පාට තීන්ත | ලීටර 1/2 |
| තැඹිලි පාට තීන්ත | ලීටර 1/2 |
| කහ පාට තීන්ත | ලීටර 1/2 |
| ටිනර් | ලීටර 1/2 |
| පින්සල් | අඟල් 01 - 01<br>අඟල් 02 - 01<br>අඟල් 03 - 01 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:17 බැංකියවත්ත පොලිතින් කාමරයට පරවියන් ඇතුල්වීම වැළැක්වීම සඳහා දැල් ආවරණ සැකසීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| 1/2 x 1/2 ඇලුමිනියම් කොටු දැල් | දිග් අඩි 100 |
| 1" x 2" රීප්ප | දිග් අඩි 400 |
| 2 - 0 රෙජින් ෂීට් | දිග් අඩි 20 |
| 2" යකඩ ඇණ | කි. ග්‍රෑ. 03 |
| 1 1/2 x 2.5 බොක්ස් බාර් | 08 |
| 1 1/2 කඳ සිහින් ඇණ | කි. ග්‍රෑ. 01 |
| කටින් වීල් | 03 |
| 12 වෙල්ඩින් කූරු | 01 |
| එනමල් තීන්ත | ලීටර 01 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:18 වර්තමානයේ රටතුල ඉන්ධන මිල ඉහළ යාම හේතුවෙන් ගල් වැලි අයිතම සැපයුම් මිල ගණන් ඉහළ ගොස් ඇති බැවින් පහත සඳහන් ද්‍රව්‍යවල මිල ගණන් ඒකක මිල රු. 750.00 කින් (කියුබ්) සංශෝධනය කර දෙන ලෙස සැපයුම්කරුවන් විසින් කරන ලද ඉල්ලීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

| **විස්තරය** | **2020-12-15 මිල කැඳවීම් අනුව දැනට පවතින මිල** | **ආයතනය** |
|---|---|---|
| කළු ගල් 6 x9 | 4,700.00 | B.M.U |
| කළු ගල් 4" | 5,500.00 | T.M.S.D සුරංග |
| කළු ගල් 3" | 8,500.00 | තිරණ |
| කළු ගල් 2" | 8,500.00 | තිරණ |
| කළු ගල් 1" | 7,490.00 | B.M.U |
| කළු ගල් 1 1/2" | 6,800.00 | T.M.S.D සුරංග |
| කළු ගල් 3/4" | 7,450.00 | T.M.S.D සුරංග |
| කළු ගල් ක්‍රෂර් 3/4" | 7,450.00 | T.M.S.D සුරංග |
| කළු ගල් 1/2" | 7,000.00 | B.M.U |
| චිප්ස් 1/4" | 6,500.00 | T.M.S.D සුරංග |
| ගල් කුඩු | 6,500.00 | T.M.S.D සුරංග |
| ABC මිශ්‍රණය | 6,850.00 | T.M.S.D සුරංග |
| ගංගා වැලි | 10,900.00 | T.M.S.D සුරංග |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ. පී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව, පහත සඳහන් පරිදි මිල වැඩි කිරීමට ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

| විස්තරය | 2020-12-15 මිල කැඳවීම් අනුව දැනට පවතින මිල | සභාවෙන් අනුමත කරන ලද නව මිල (රු) | ආයතනය |
|---|---|---|---|
| කලු ගල් 6 x9 | 4,700.00 | 5,000.00 | B.M.U |
| කලු ගල් 4" | 5,500.00 | 6,000.00 | T.M.S.D සුරංග |
| කලු ගල් 3" | 8,500.00 | 9,000.00 | තිරණ |
| කලු ගල් 2" | 8,500.00 | 9,000.00 | තිරණ |
| කලු ගල් 1" | 7,490.00 | 7,990.00 | B.M.U |
| කලු ගල් 1 1/2" | 6,800.00 | 7,300.00 | T.M.S.D සුරංග |
| කලු ගල් 3/4" | 7,450.00 | 7,950.00 | T.M.S.D සුරංග |
| කලු ගල් කුෂර් 3/4" | 7,450.00 | 7,950.00 | T.M.S.D සුරංග |
| කලු ගල් 1/2" | 7,000.00 | 7,500.00 | B.M.U |
| චිප්ස් 1/4" | 6,500.00 | 7,000.00 | T.M.S.D සුරංග |
| ගල් කුඩු | 6,500.00 | 7,000.00 | T.M.S.D සුරංග |
| ABC මිශ්‍රණය | 6,850.00 | 7,350.00 | T.M.S.D සුරංග |
| ගංගා වැලි | 10,900.00 | 11,400.00 | T.M.S.D සුරංග |

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:19 ගරු නාගරික මන්ත්‍රීවරුන් වෙනුවෙන් A4 ප්‍රමාණයේ වර්ණ ලිපි ශීර්ෂ 1900 ක් මුද්‍රණය කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:20 බැංකියවත්ත කොම්පෝස්ට් පොහොර සඳහා පොහොර කවර 1000 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් රු.82,000.00 ක මුදල සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

සභාව සතු වාහන තක්සේරු කිරීමට අදාල තක්සේරු වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

| අනු අංකය | නම | වාහන අංකය | තක්සේරු කරන ලද වර්තමාන වටිනාකම |
|---|---|---|---|
| 1 | යතුරු පැදිය | VI 1833 | 110,000.00 |
| 2 | යතුරු පැදිය | JD 4684 | 65,000.00 |
| 3 | යතුරු පැදිය | UQ 1933 | 50,000.00 |
| 4 | ජේ.සී.බී යන්ත්‍රය | ZA 5039 | 10,000,000.00 |
| 5 | ජේ.සී.බී යන්ත්‍රය | HF 7899 | 2,500,000.00 |
| 6 | ට්‍රැක්ටරය | GK 1483 | 800,000.00 |
| 7 | ට්‍රැක්ටරය | HF 8558 | 500,000.00 |
| 8 | ට්‍රැක්ටරය | GK 6227 | 500,000.00 |
| 9 | ට්‍රැක්ටරය | HF 8952 | 500,000.00 |
| 10 | ට්‍රැක්ටරය | 37-7933 | 500,000.00 |
| 11 | ට්‍රැක්ටරය | RE 2600 | 1,200,000.00 |
| 12 | ට්‍රැක්ටරය | RB 4786 | 800,000.00 |
| 13 | ට්‍රැක්ටරය | RC 1107 | 800,000.00 |
| 14 | ට්‍රැක්ටරය | RC 1118 | 800,000.00 |
| 15 | ට්‍රැක්ටරය | RC 8183 | 800,000.00 |
| 16 | ට්‍රැක්ටරය | RD 8240 | 1,500,000.00 |
| 17 | ට්‍රැක්ටරය | RD 8000 | 1,200,000.00 |
| 18 | ට්‍රේලරය | RV 8543 | 175,000.00 |
| 19 | ට්‍රේලරය | RW1639 | 150,000.00 |
| 20 | ට්‍රේලරය | 44-7142 | 150,000.00 |
| 21 | ට්‍රේලරය | RW5784 | 150,000.00 |
| 22 | ට්‍රේලරය | RW1962 | 150,000.00 |
| 23 | ට්‍රේලරය | 67-1565 | 75,000.00 |
| 24 | ට්‍රේලරය | 46-3164 | 75,000.00 |

| | | | |
|---|---|---|---|
| 25 | ට්‍රේලරය | 67-3301 | 175,000.00 |
| 26 | ට්‍රේලරය | 46-4907 | 75,000.00 |
| 27 | ට්‍රේලරය | HI 2234 | 160,000.00 |
| 28 | ට්‍රේලරය | HI2269 | 160,000.00 |
| 29 | ට්‍රේලරය | RX2069 | 150,000.00 |
| 30 | ට්‍රේලරය | RX2332 | 175,000.00 |
| 31 | ට්‍රේලරය | RX4400 | 80,000.00 |
| 32 | කෘ කැබ් රථය | 56-1906 | 2,000,000.00 |
| 33 | කෘ කැබ් රථය | LL 7688 | 2,750,000.00 |
| 34 | කැබ් රථය | PF 4006 | 8,000,000.00 |
| 35 | ගලි බවුසරය | ZA 9835 | 10,000,000.00 |
| 36 | ගලි බවුසරය | 227-5020 | 2,250,000.00 |
| 37 | ගිණි නිවන රථය | ZA 0228 | 10,000,000.00 |
| 38 | ටිපර් රථය | 226-7521 | 2,250,000.00 |
| 39 | ත්‍රී රෝද රථය | QL 2901 | 325,000.00 |
| 40 | වෑන් රථය | ND 5124 | 6,000,000.00 |
| 41 | ජල බවුසරය | LL 2110 | 5,000,000.00 |
| 42 | මෝටර්ග්‍රේඩරය | ZA 5326 | 20,000,000.00 |
| 43 | බොබ්කැට් යන්ත්‍රය | S130S/NO529218293 | 800,000.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:22 කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් පෞද්ගලික බස් රථ නැවැත්වීමේ ගාස්තු අඩු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පැවසුවේ පසුගිය මහ සභාවේ මේ සඳහා ඉදිරිපත් කළ ක්‍රමවේදය අපැහැදිලි බැවින් මෙදින සභාවට ඉදිරිපත් කළ අතර, පැහැදිලි තීරණයක් ගෙන ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගත යුතු බවයි.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් මෙම අවස්ථාවේ මාසික කුලිය ලබා දීමට මුදල් නොමැති බව ඔවුන් පැවසූ බව සඳහන් කරන ලදී.

මේ සම්බන්ධව පැහැදිලි කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමියගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව මැයි හා ජූනි මාස දෙක සඳහා පමණක් දැනට අය කරනු ලබන මාසික ගාස්තුවෙන් 25% ක් අය කිරීමට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:23 කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් බළන්ගොඩ තානායමේ කුලිය අඩු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳව සභාවේ සිදු වූ සාකච්ඡාවෙන් අනතුරුව ජූලි හා අගෝස්තු මාස දෙක සඳහා මාසික කුලියෙන් 50% බැගින් අය කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:24 පහත සඳහන් ක්ෂේත්‍ර ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

i. බළන්ගොඩ නගර සභාව සතු දැන්වීම් පුවරු 10 ක් ටෙන්ඩර් කිරීම සඳහා ප්‍රාදේශීය ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ii. බළන්ගොඩ නගර සභාව සතු මහජන පොළ ආපන ශාලාව ටෙන්ඩර් කිරීම සඳහා ප්‍රාදේශීය ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

iii. බළන්ගොඩ නගර සභාව සතු පොදු වැසිකිළි ටෙන්ඩර් කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම හා අවම ලංසු මුදල තීරණය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පැවසුවේ ටෙන්ඩර් කාල සීමාව 2021 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වන බැවින් නැවත ටෙන්ඩර් කිරීම හා අවම ලංසු මුදල තීරණය කළ යුතු අතර, ටෙන්ඩර් කිරීමේ දී අවම ලංසු මුදල යම් ප්‍රමාණයකින් වැඩි කළ යුතු බවයි. ඒ අනුව වැසිකිළි ගාස්තුව ද තීරණය කරන ලෙස වැඩිදුරටත් පවසන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්. පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් කුලිය අඩු කරන ලෙස සියලු දෙනා ඉල්ලීම් කරන අවස්ථාවක ටෙන්ඩර් මුදල වැඩි කිරීමේ කිසිඳු තේරුමක් නොමැති බව පැවසීය.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, එවැනි වසංගත තත්ත්වයක දී ටෙන්ඩර් මුදල කොපමණකින් වැඩි වුව ද මාසික මුදලින් යම් ප්‍රමාණයක් වශයෙන් අඩු වෙන බැවින් ටෙන්ඩර් මුදල වැඩි වීමේ ගැටලුවක් නොමැති බව පවසන ලදී.

ඒ අනුව ප්‍රසිද්ධ ටෙන්ඩර් පටිපාටිය යටතේ නගර සභාව සතු පොදු වැසිකිළි ටෙන්ඩර් කිරීමටත්, පසුගිය වර්ෂයේ අවම ලංසු මුදල වූ රු. 70, 100.00 ක මුදලට 10% ක් වැඩි කර, අවම ලංසු මුදල වශයෙන් රු. 77,110.00 ක මුදල සුදුසු බවටත්, ගරු සභාපතිතුමන් විසින් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:25 සුරකිමු ගංගා වැඩසටහන වෙනුවෙන් ඇස්තමේන්තුගත මුදලින් 25% ක් සභාවෙන් දැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පැවසුවේ අහිමි වීමට ගිය මෙම ව්‍යාපෘතිය නැවත ලබා ගැනීමට කටයුතු කළ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාට මෙන්ම ගරු

නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමාගේ දායකත්වය සම්බන්ධව ද තමන් ස්තුතිවන්ත වන බවයි. මෙම ව්‍යාපෘතිය සඳහා බළන්ගොඩ නගර සභාව සමඟ පරිසර අමාත්‍යාංශය, විධායක ඉංජිනේරු කාර්යාලය හා ITI ආයතනය සම්බන්ධ වන අතර, මුළු ඇස්තමේන්තු මුදල රුපියල් ලක්ෂ 52 ක් වන බවද එයින් 25% ක් බළන්ගොඩ නගර සභාව විසින් දැරිය යුතු බවද ගරු සභාපතිතුමා පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් තම පාලන කාලය තුළ දී අවුරුදු 10 කට 20 කට පමණ කාලයකට සකස් කළ ඇස්තමේන්තු පැවති බව ද එයින් එක් ඇස්තමේන්තුවක නගරය හරහා මළ නල පද්ධතියක් සකස් කිරීම පිළිබඳව ඇති අතර අනෙක් ඇස්තමේන්තුවෙහි බැංකියවත්ත සඳහා මෙම අනුමත වී ඇති ව්‍යාපෘතිය පැවති බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:26 කොම්පෝස්ට් පොහොර හැලීමෙන් පසු ඉතිරි වෙන කොටස් විශාල වශයෙන් ගොඩ ගැසී ඇති බැවින් භූමිය තුල ඉඩ සකසා ගැනීමටත්,එම කසල නැවත හලා පොහොර බවට පත් කර ගැනීමටත් අවශ්‍ය 120 එක්ස්කැවේටර් යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් මෙම එක්ස්කැවේටර් යන්ත්‍රය නව මිලදී ගැනීමක් ද නැත්නම් කුලියට ගැනීමක් ද යන්න සටහන් කරන ලෙස පවසන ලදී.

මෙහි දී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පැවසුවේ 120 එක්ස්කැවේටර් යන්ත්‍රයක් කුලියට ගැනීම සඳහා මිල ගණන් කැඳවීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීමට මෙම යෝජනාව ඉදිරිපත් කළ බවයි. එමෙන්ම පසුගිය සභාවේ දී මෙම යෝජනාව ඉදිරිපත් කර අනුමත වීමෙන් පසු මිල ගණන් ලබා දුන් පුද්ගලයන් විසින් ගැටලුවක් ඇති කළ බැවින් නැවතත් සභාවට යොමු කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ බව වැඩිදුරටත් ගරු සභාපතිතුමා පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:27 බැංකියවත්ත ගලි ප්‍රතිකාරක පද්ධතියේ වියලුම් කුටීර සකස් කිරීම සඳහා බුලත්ගම එක්සත් මිතුරු සංසදය වෙත ලබා දීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ ප්‍රේමකුමාර මැතිතුමා මෙහි ඇස්තමේන්තු මුදල කොපමණ ද යන්නත් බුලත්ගම එක්සත් මිතුරු සංසදය විසින් ඉල්ලීමක් කර ඇත් දැයි විමසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් මෙහි ඇස්තමේන්තු මුදල රු. ලක්ෂ 10ක් වන අතර, බුලත්ගම එක්සත් මිතුරු සංසදය විසින් ඉල්ලීමක් කර ඇති බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:28 2021 වර්ෂය තුල තෝරාගත් අඩු ආදායම්ලාභීන් සඳහා වැසිකිළි ආධාර ලබා දීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:29 සුරකිමු ගංගා වැඩසටහන යටතේ අප ජල පෙරහන් පද්ධතියක් සකස් කිරීමේ කටයුතු සෘජු ශ්‍රමය යටතේ සභාව විසින් සිදු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:30 2021 අගෝස්තු මස කර්මාන්ත අංශයේ නඩත්තු සඳහා ද්‍රව්‍ය වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

| ද්‍රව්‍ය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|
| ගල් කුඩු කියුබ් | 07 |
| සිමෙන්ති බෑග් | 30 |

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණය**

දිනකට සේවකයන් 15 බැගින් දින 25 කට කම්කරුවන් 375ක් අවශ්‍ය වේ.

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය රථවාහන**

| | |
|---|---|
| ටිපර් රථය | දින 25 |
| ට්‍රැක්ටර් රථය | දින 25 |
| D/D රෝල | දින 15 |
| JCB යන්ත්‍රය | පැය 50 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:31 2021 අගෝස්තු මස කර්මාන්ත අංශය මඟින් සිදුකිරීමට අපේක්ෂිත නඩත්තු සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

I. රත්නපුර දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපති ගරු අකිල එල්ලාවල මැතිතුමාගේ නිවෙස් පාරේ කොලරය පුරවා නඩත්තු කිරීම.

II. කරවිකැටිය 05 වන පටුමඟ මාර්ගය නඩත්තු කිරීම.

III. අක්කර 18 මාර්ගය නඩත්තු කිරීම

IV. ගොරොක්ගහමඩ පල්ලිය ඉදිරිපිටින් අක්කර 18 ප්‍රදේශය සම්බන්ධ වන වටරවුම් මාර්ගය නඩත්තු කිරීම

V. බළන්ගොඩ, තුඹගොඩ ,කෝපිවත්ත පාර, නො.33 ලිපිනයෙහි පදිංචි ඩබ්.ඇම්.සුනිල් ශාන්ත මහතා ඉදිරිපත් කරන ලද ලිපිය අනුව කෝපිවත්ත ගමේ වැසි ජලය බැස යන ප්‍රධාන කාණු පද්ධතියේ පාරෙන් ඉවතට බැස යන ජලය හේතුවෙන් ඇතිවන ගැටලුව විසඳීම

VI. බලන්ගොඩ, දොරවෙල, නො.57 ලිපිනයෙහි පදිංචි කේ.සුමිත් රෝහිත අමරදාස මහතා විසින් ඉදිරිපත් කළ ලිපිය අනුව දොරවෙල මැද පාර ගම්මානයේ නිවාස 09 කට පමණ නල ජලය ලබාගැනීම සඳහා මාර්ගයේ දික්මීටර් 200ක් පමණ මාර්ගය පළුදු කිරීමට මාර්ග පළුදු ගාස්තු නිදහස් කරන ලෙස ඉල්ලීම

VII. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී පළාත් සභා හා පලාත් සභා හා පලාත් පාලන කටයුතු රාජය අමාත්‍ය රොෂාන් රණසිංහ මැතිතුමාගේ SM/PCLG/M/GEN-03 සහ 2021-07-01 දිනැති ලිපිය අනුව ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් සංවර්ධන යෝජනා ලබාගැනීම

ඉහත සඳහන් යෝජනා ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා, තමන් විසින් ප්‍රදේශයේ අඩුපාඩු කිහිපයක් පිළිබඳව වාචිකව කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කළ අතර, කර්මාන්ත කමිටු සභාපතිතුමා එම අවස්ථාවේ දී අදාල අඩුපාඩු සකස් කර දෙන බවට පොරොන්දු වූ නමුත් එම යෝජනා අද දින න්‍යාය පත්‍රයට එක් කර නැත්තේ මන්දැයි විමසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ.ඩබ්. පී. ගුණරත්න මැතිතුමා පැවසුවේ තමන් විසින් ඉදිරිපත් කළ කිරිඳිගල යෝජනාව තවම ඉටු වී නොමැති බවයි.

මේ සම්බන්ධව කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ. පී. පේමදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී ඊ. එම්. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා මෙම කරුණු සම්බන්ධව හැකි ඉක්මනින් පරීක්ෂා කර බලා අදාල කටයුතු ක්‍රියාත්මක කරන බව පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:32 පෙරටු කාර්යාලය හා සරප් සඳහා මුදල් නෝට්ටු ගණින යන්ත්‍රයක් මිල දී ගැනීම වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:33 ගලි බවුසරයේ ගියර් පෙට්ටිය අලුත්වැඩියා කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

## 07. මිල ගණන් අනුමත කිරීම

| | විස්තරය | ආයතනය | මුදල (රු) |
|---|---|---|---|
| 07:01:01 | ගබඩා අවශ්‍යතා ලෙස Toner හා Ribbon මිල දී ගැනීම | PC Systems | 285 A Toner – 3750 x 10 = 37,500.00<br>255 A Toner – 9500 x 5 = 47,500.00<br>Epson LQ 2090 Ribbon – 4250 x 3 = 12,750.00 |
| 07:01:02 | ගිණුම් අංශය සඳහා 19" LED මොනිටර් එකක් මිල දී ගැනීම | Wisdom Computer Technologies | රු. 17,700.00 |
| 07:01:03 | බැංකියවත්ත ප්ලාස්ටික් පොලිතින් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ පොලිතින් කපන මැෂිමේ බ්ලෝවර් ෆෑන් එක අලුතින් සෑදීම ( ඉන් එක අගල් 6 සහ අවුට් එක අගල් 04) | කීර්ති ඉංජිනියර් වර්ක්ස් | රු. 50,000.00 |
| 07:01:04 | බැංකියවත්ත ප්ලාස්ටික් පොලිතින් ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ පොලිතින් කැපීමට ඇති අදාල මැෂිමේ මෝටරය මිල දී ගැනීම | කැළණි ඒජන්සීස් | රු. 27,800.00 |
| 07:01:05 | I. බැංකියවත්ත පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය GRP(පොස්පේට්) මිටි 500 ක් මිල දී ගැනීම<br><br>II. ප්‍රාදේශීය මිල කැඳවීම් මත මිටි 100 ක් කි.මී. 600 ප්‍රවාහනය සඳහා ලැබී ඇති අවම මිල | ලංකා පොස්පේට් ලිමිටඩ්<br><br>එස්. බාලක්‍රිෂ්ණන් | ප්‍රවාහනය රහිත මිල - රු.550.00<br>ප්‍රවාහනය සහිත මිල - රු.680.00 (50 Kg)<br><br>රු. 31,000.00<br><br>(පවතින කොරෝනා වසංගත තත්ත්වය යටතේ වැඩි පොස්පේට් ප්‍රමාණයක් එකවර ප්‍රවාහනය කිරීම වඩා ලාභදායී බැවින් සංස්ථාවෙන් ලබා දී ඇති මිල ගණන් යටතේ ප්‍රවාහනය සහිතව මිලදී ගැනීම) |
| 07:01:06 | විෂබීජහරණය සඳහා අවශ්‍ය සෝඩියම් හයිප්‍රොක්ලෝරයිඩ් මිල දී ගැනීම (ලීටරයක මිල රු.62.64 බැගින් ලීටර් 500) | පරන්තන් කෙමිකල්ස් | රු.31,320.00 |
| 07:01:07 | රට තුළ උද්ගතව ඇති කොවිඩ් අවදානම හේතුවෙන් විෂබීජහරණය සඳහා අවශ්‍ය ක්ලෝරීන් බැරල් 10 ක් ( 10 X 50 kg) | ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය - රත්නපුර | රු. 84,583.84 |

| | | | |
|---|---|---|---|
| | මිල දී ගැනීම- (කි.ග්‍රෑ 01 ක් රු. 169.17 බැගින් කි.ග්‍රෑ 500) | | |
| 07:01:08 | බැංකියවත්ත ගලි වල ආවරණය සඳහා අවශ්‍ය අගල් 1 1/2 අඹ ලෑලි අඩි 200ක් මිලදී ගැනීම | කැන්ඩි ටිම්බර් | දික් අඩියක් රු. 70<br>වර්ග අඩියක් රු. 140 |
| 07:01:09 | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී සඳහා පුටුවක් මිලදී ගැනීම | සෙනෙවිරත්න ට්‍රේඩ් සෙන්ටර් | රු. 15,500.00 |
| 07:01:10 | බැංකියවත්ත සඳහා අවශ්‍ය දුගඳ නාශක ද්‍රව්‍ය ලීටර් 60ක් (Redoll - OE) මිලදී ගැනීම | United Glass Nugegoda | ලීටර් 01 - රු. 2,700.00 |
| 07:01:11 | සභාව සතු HF 7899 JCB යන්ත්‍රය 2021-09-13 සිට ඉදිරි වසරක කාලයක් සඳහා රක්ෂණය කිරීම වෙනුවෙන් රක්ෂණ ගාස්තු ගෙවීම | ජාතික රක්ෂණභාර අරමුදල | රු. 16,230.68 |
| 07:01:12 | පිළිගැනීමේ කවුන්ටරයේ ඇති පරිගණකය සඳහා H 81 Mother Boad එකක් මිල දී ගැනීම | විස්ඩම් කම්පියුටර් ආයතනය | රු. 13,900.00 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:01:13 ගබඩා අවශ්‍යතා සඳහා කැඳවන ලද මිල ගණන් අනුමත කිරීම

| ද්‍රව්‍ය | ප්‍රමාණය | ඒකක මිල | ආයතනය |
|---|---|---|---|
| A 4 Paper සුදු | බන්ඩල් 100 | 710.00 JK | චන්ද්‍රා/ ජෝති ස්ටෝර්ස් |
| ග්ලාස් ක්ලිනර්(බ්‍රයිටොප් සහ ඩැස්) | 10 | 210.00 | චන්ද්‍රා/ජෝති ස්ටෝර්ස් |
| Finol කෑන් | 10 | 560.00 | නිව් ජෝති ස්ටෝර්ස් |
| Lifeboy සබන් (ලොකු) | 1000 | 53.40 | චන්ද්‍රා ස්ටොර්ස් |
| Air freshner | 10 | 295.00 | ජෝති ස්ටෝර්ස් |
| CR I | 30 | 47.00 (සම්මාන) | ජෝති ස්ටෝර්ස් |
| CR II | 30 | 78.00 (සම්මාන) | ජෝති ස්ටෝර්ස් |
| CR IV | 10 | 142.00 (සම්මාන) | ජෝති ස්ටෝර්ස් |
| Normal File | 500 | 5.50 | නිව් ජෝති ස්ටෝර්ස් |
| පොඩි ලියුම් කවර 6X 3 | 1000 | 1.00 | නිව් ජෝති ස්ටෝර්ස් |
| ලීගල් කොළ | බන්ඩල් 03 | 975.00 JK | ජෝති ස්ටෝර්ස් |

| | | | |
|---|---|---|---|
| A 3 කොළ | බන්ඩල් 01 | 1540.00 JK | ජෝති ස්ටෝර්ස් |
| හාෆ්ශීට් | බන්ඩල් 05 | 390.00 (සම්මාන) | ජිනසිරි ස්ටෝර්ස් |
| සැනිටයිසර් (ඇල්කොහොල් ප්‍රතිශතය 75-76%) | ලීටර් 30 | 625.00 | සුපර් කෙයාර්/ නිව් ජෝති ස්ටෝර්ස් |
| මිනි සබන් | 300 | 7.50 | ජිනසිරි ස්ටෝර්ස් |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:01:14 ගබඩා අවශ්‍යතා සඳහා ආකෘති බිල් පොත් මිල ගණන් අනුමත කිරීම

| ද්‍රව්‍ය | ප්‍රමාණය | ඒකක මිල | ආයතනය |
|---|---|---|---|
| කසළ ප්‍රතිචක්‍රීකරණ පොත් (කාබනයිස් පිටපත් 04 සහිතව බිල් 50ක්) | 50 | 435.00 | සීගිරි ප්‍රින්ටර්ස් |
| අතිකාල දීමනා (දෙපැත්ත මුද්‍රණය) | 1000 | 3.50 | කරුණාරත්න ප්‍රින්ටර්ස් |
| වවුචර් ආකෘති (ලීගල් දෙපැත්ත මුද්‍රණය) | 1000 | 4.50 | සීගිරි ප්‍රින්ටර්ස් |
| ගමන් වියදම් (දෙපැත්ත මුද්‍රණය) | 1000 | 3.50 | කරුණාරත්න ප්‍රින්ටර්ස් |
| හරස් සටහන් පොත් ( කාබනයිස් පිටපත් 03 සහිතව බිල් 100) | 100 | 575.00 | කරුණාරත්න ප්‍රින්ටර්ස් |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

07:01:15 සුරකිමු ගංගා වැඩසටහන යටතේ ජල සාම්පල් පරීක්ෂාව වෙනුවෙන් Lindel Industrial Laboratories Limited වෙතින් ඉදිරිපත් වී ඇති අවම මිල ගණන වන රුපියල් 51,450.00 ක මුදල අනුමත කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් සුරකිමු ගංගා වැඩසටහන යටතේ පරිසර අමාත්‍යාංශය හා IPI ආයතනය විසින් Waste Water ආරම්භ වන ස්ථානය, මධ්‍ය ස්ථානය හා ගංගාව යන ස්ථාන තුනෙන් ජල සාම්පල් 03 ක් ඉල්ලා ඇති බව ද, ඒ අනුව ජල සාම්පල් පරීක්ෂාව වෙනුවෙන් අවම මිල ගණන වශයෙන් රුපියල් 51,450.00 ක මුදලක් Lindel Industrial Laboratories Limited වෙතින් ඉදිරිපත් කර ඇති බව ද පවසන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය මගින් ජල සාම්පල් පරීක්ෂාවක් සිදු කළ හැකි දැයි විමසන ලදී. එමෙන්ම මෙම මිල ගණන් ඉදිරිපත් කර ඇති ආයතනවල වාර්තා තුල එකිනෙකට වෙනස් අයිතම ද පවතින බව පැවසීය.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, ජල සාම්පල් පරීක්ෂාව සඳහා සුදුසු ආයතන ලැයිස්තුව පරිසර අමාත්‍යාංශයෙන් ලබා දුන් බව ද මෙම අයිතම අතරින් අවශ්‍ය කරන අයිතම පමණක් පැවතීම ප්‍රමාණවත් බව ද පරිසර අමාත්‍යාංශය මඟින් කමිටුවට ඉදිරිපත් කර අවශ්‍ය කටයුතු සිදු කරන බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. මන්ත්‍රී යෝජනා**

**08:01 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

08:01:01 නව මහජන පොළේ ඇති වැසිකිළිය ගැන සභාවේ දී ගත් තීන්දු පරිදි බළන්ගොඩ නගරයට පිටින් පැමිණෙන පුද්ගලයන්ට සහ සංචාරකයන්ට පාවිච්චි කළ හැකි අන්දමට අළුත්වැඩියා කොට නඩත්තු කර දීම

08:01:02 ලංකා බැංකු මාවත නමින් නම් කරන ලද මාර්ගයට අවශ්‍ය නාම පුවරුව ස්ථාපනය කිරීම සඳහා නගර සභාවේ අවසරය දෙන ලිපියක් නිකුත් කිරීම

08:01:03 පුස්තකාලය දැනට වසා ඇති බවත් රජයේ ගන්නා තීන්දු අනුව නොබෝ දිනකින් විවෘත කල හැකි බව වැටහේ. කියවීම් ශාලාව සඳහා ගත් විදුලි පංකා සවිකළ යුතුයි. පත්තර කියවීම සඳහා ඇති මේසය දැනට දිරා ගොස් ඇත. පසුගිය දිනක නිරීක්ෂණය කිරීමේ දී රාක්ක කිහිපයක අඩුවක් දුටු අතර මෙම අවශ්‍යතා නිවාඩු දිනවල සපුරා ගත යුතුයි. මේ සඳහා පසුගිය සභාවක අනුමැතිය හිමි විය. වැදගත්ම දේ පුස්තකාලයේ නාම පුවරුව නොමැති වීමයි. කරුණාකර හැකි ඉක්මනින් මෙම අවශ්‍යතා සපුරා නඩත්තු කර දෙන්න.

08:01:04 කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කළ යෝජනා

I. සිරි වීරසුන්දරාරාමයට හැරෙන හංදියේ ඇති විශාල කපොල්ල කොන්ක්‍රීට් තහඩු දමා ආවරණය කරදීම
II. නගරයේ කාර්පාර්ක් ඉදිරිපිට කලින් දැන්වූ පරිදි නව බස් නැවතුම්පොළ වංගුව ක්‍රමානුකූලව පිළිසකර කිරීම
III. නගරයේ තැන් තැන්වල පදිකයන් කාණුවට වැටෙන කපොලු ආවරණය කිරීම
IV. ශ්‍රී ලංගම භූමියේ ඇති ,අනවශ්‍ය ගැටි,ඉවත් කර දුර ගමන් සේවා බස් රථවලට පහසුකම් සැලසීම
V. නගරයේ කාණුවල දුගඳ හමන තැන් බලා පවිත්‍ර කරදීම
VI. මහමෙව්නා පාරේ කාපට් ව්‍යාපෘතිය පරක්කු වන බැවින් එම මාර්ගය භාවිතා කරන නිවැසියන්ට යා හැකි තරමින් මාර්ගය වලවල් වසා නඩත්තු කරදීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා නව මහජන පොළේ ඇති වැසිකිළිය අලුත්වැඩියා කිරීම සම්බන්ධව මීට පෙර වැඩ අධිකාරීතුමා සමඟ ස්ථානීය පරීක්ෂාවක් සිදු කර වැඩ කටයුතු ආරම්භ කළ නමුත් එය මග නැවතී ඇති බව ද එම ස්ථානයේ විවේක කාමරයක් ඉදි කර තිබෙන අතර, ඒ කාගේ උවමනාවකට කළ ඉදිකිරීමක්දැයි විමසන ලදී. එමෙන්ම එම කාමරය තුල මත් ද්‍රව්‍ය භාවිත කරන අනවසර මිනිසුන් රැඳී සිටින බැවින් ඔවුන්ගේ අසභ්‍ය වචන නිසා අවට වෙළඳසැල්වලට මෙන්ම මිනිසුන්ට ද මහත් කරදරයක් වී ඇති බව ද ලංකාවේ සංචාරකයන් පොළ භූමියේ වාහන නවතා ගිමන් හරින බැවින් ඔවුන්ට ප්‍රයෝජනවත් වන පරිදි මෙම වැසිකිළිය අලුත්වැඩියා කර දෙන ලෙස තමන් මෙහිදී යෝජනා කරන බව ද පැවසීය.

මේ සම්බන්ධව පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, සංචාරකයන් සඳහා අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් ලබා දීමේ අරමුණින් තමන් විසින් වැසිකිළි පහසුකම් ඇති කිරීමට අදාලව යෝජනාවන් සිදු කළ ද කිසියම් හෝ පිරිසකගේ බලපෑමක් මත එය නැවතී ඇති බව ද තමන්ට දේශපාලන නිදහසක් හෝ බලයක් නොමැති බැවින් ඉවසීමෙන් කටයුතු කරන බව ද අහිමි වූ ව්‍යාපෘති නැවත ලබා ගැනීමට අපේ කණ්ඩායම එකතු වී ක්‍රියා කරනු ඇතැයි තමන් විශ්වාස කරන බව ද පවසන ලදී.

මෙහි දී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුවේ එම ව්‍යාපෘති නැවතුණේ ඇයිදැයි නොදන්නා නමුත් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා සමඟ මේ සම්බන්ධව කතා කළ අතර, එහි දී මෙම ව්‍යාපෘති නැවත ලබා ගැනීමට අවශ්‍ය කටයුතු එතුමා විසින් ගනු ලබන බව පැවසූ බවයි.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් නව මහජන පොළේ ඇති වැසිකිළිය සඳහා වියදමක් නොමැතිව කළ හැකි වැඩ කොටස කරන ලෙස පවසන ලදී.

තවදුරටත් තම යෝජනා සම්බන්ධයෙන් අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ලංකා බැංකු මාවත නමින් නම් කරන ලද මාර්ගයට අවශ්‍ය නාම පුවරුව ස්ථාපනය කිරීම සඳහා ලංකා බැංකුව වෙත නගර සභාවේ අවසරය ලබා දෙන බවට ලිපියක් නිකුත් කරන ලෙසත් පුස්තකාලයේ අඩුපාඩු මෙම කාල සීමාවේ සිදු කර පුස්තකාල නාම පුවරුව සකස් කර දෙන ලෙසත් පවසන ලදී.

මෙහි දී අදහස් දැක් වූ ගරු සභාපතිතුමා පැවසුවේ මීට පෙර අවස්ථාවක දී පුස්තකාල නාම පුවරුව සඳහා ඉදිරිපත් කළ ඇස්තමේන්තුවෙහි මිල ගණන් අධික බව පවසා පුද්ගලික දානපතියෙකු මඟින් එය සකස් කර දෙන බවට ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමා සඳහන් කළ බවයි.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් තමන් පැවසුවේ විශාල මුදලක් වැය නොකර පුද්ගලික දානපතියෙකු මඟින් හෝ කර ගැනීමට කටයුතු කරමු යැයි බව ද නගර සභා නාම පුවරුව ඉහළින් ස්ථාපනය කර ඊට යටින් පුස්තකාල නාම පුවරුව ස්ථාපනය කරන ලෙස ද පැවසීය.

නැවතත් ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් පැවසුවේ එම ඇස්තමේන්තුවෙහි වෙනස්කම් සිදු කර නාම පුවරුව සකස් කිරීමට හැකියාව තිබුණු බවයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ හොඳම පුස්තකාලය යැයි ද මෙහි පෞඪත්වය ආරක්ෂා කර ගත යුතු යැයිද පවසන නමුත් ටික කාලයකින් එම සියලු දේ වෙනස් වී සාමාන්‍ය පුස්තකාලයක් ලෙස කතා කරන බව ද වැඩිදුරටත් ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු සභාපතිතුමා තවදුරටත් අදහස් දක්වමින් වර්තමානයේ ප්‍රාග්ධන වියදම් කිරීමට නොහැකි බැවින් පුස්තකාලය අසල බළන්ගොඩ නගර සභාව නාම පුවරුව ඉහළින් වන සේ ස්ථාපනය කිරීම, නගර සභා කාර්යාලයට හැරෙන ස්ථානයේ නාම පුවරුවක් ස්ථාපනය කිරීම, නගර සභාවේ ප්‍රධාන ගේට්ටුව වෙනස් කිරීම, හා ඔරලෝසු කණුව ආසන්නයේ පවතින අබලන් වී ඇති නාම පුවරුව සකස් කිරීම යන කරුණු සම්බන්ධයෙන් සියලු කටයුතු සූදානම් කරගෙන තබා ගන්නැයි වැඩ අධිකාරීතුමාට පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:02 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

08:02:01 2021-07-30 වන දින බළන්ගොඩ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී සාකච්ඡාවට භාජනය වූ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග දෙපස ගොඩනැගිලි ඉදි කිරීම් සීමාව වන අඩි 33 ක සීමාවේ ඉදිකිරීම් සඳහා නිර්වන්දි ගිවිසුමකට යටත්ව ඉදිකිරීම් සිදු කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලබා දුන් බවත්, වර්තමානයේ නිර්වන්දි ගිවිසුම්ගත දුර ප්‍රමාණය අඩි 50 ක් බවට සංශෝධනය කර ඇති බවත් අනාවරණය විය. ඉන්පසුව මේ කාරණාව දීර්ඝ වශයෙන් සාකච්ඡා කර විසඳුමක් ලබා දීමට කමිටුවක් පත් කර ඇත.

බළන්ගොඩ නගරය පසුකර යාමේ දී විකල්ප මාර්ග දෙකක් පවතින බවත් එක් පසෙකින් බාන්ස් රත්වත්ත මාවත පිහිටා තිබීම සහ අනෙක් පසින් ඉදිරියේ දී විශාල සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීමට යෝජිත භූමිය සහ එම භූමියේ පිවිසුම් මාර්ගය පිහිටා තිබීම නිසාත් මෙම කාරණාව සුවිශේෂී කාරණාවක් ලෙස පෙන්වා ප්‍රධාන වීදිය කොටස නගර සභා මාර්ග කොටසක් ලෙස සැලසුම් අනුමැතියේ දී සැලකීමට මාර්ග සංවර්ධන අධිකාරිය එකඟ කරවා ගැනීමට පත් කරන ලද කමිටුවට යෝජනා කිරීම

08:02:02 කොවිඩ් 19 වසංගත රෝගී තත්ත්වය හමුවේ නොසැලී පසුගිය කාල සීමාව පුරාවටම තම කර්මාන්තශාලාවෙන් එක් කොවිඩ් ආසාදිතයෙකු හෝ බිහි වීමට ඉඩ නොදී මනා කළමනාකාරිත්වයකින් යුතුව කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු අඛණ්ඩව ක්‍රමවත්ව පවත්වාගෙන ගිය සේනක සෙන්ස් ආයතනය ඇගයීමට ලක් කිරීමට ගරු සභාවට යෝජනා කිරීම

08:02:03 නගර සභාවේ මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය දායක කරගෙන ලේ දන්දීමේ වැඩසටහනක් සංවිධානය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග දෙපස ගොඩනැගිලි ඉදි කිරීම් සීමාව වන අඩි 33 - 50 අතර සීමාවේ ඉදිකිරීම් සඳහා නිර්වන්දි ගිවිසුමකට යටත්ව සැලසුම් කමිටු අනුමැතිය ලබා දෙන නමුත් වර්තමානයේ ඒ සඳහා අඩි 50ක් තබා සියලුම ඉදිකිරීම් කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වාචික උපදෙස් පමණක් ලබා දෙන බැවින් ඒ සඳහා චක්‍රලේඛයක් හෝ නීතිමය ලියවිල්ලක් අවශ්‍ය බවට ගරු සභාපතිතුමා විසින් 2021-07-30 වන දින බළන්ගොඩ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත කරන ලද ඉල්ලීම සම්බන්ධව මෙහි දී තමන් සාකච්ඡා කරන බව පැවසීය.

ඒ අනුව එවැනි ඉල්ලීමක් මත චක්‍රලේඛයක් නිකුත් කළහොත් මුළු රට තුළම ක්‍රියාත්මක වෙන පොදු චක්‍රලේඛයක් ලැබෙන බව ද බළන්ගොඩ නගරයේ විකල්ප මාර්ග දෙකක් පවතින බැවින් ප්‍රධාන වීදියේ මූලික අවශ්‍යතාවයක් ඉදිරියේ දී පැන නොනගින බව ද බළන්ගොඩ පාරම්පරික වෙළඳ ප්‍රජාවක් හා ඉඩම් හිමියන් සිටින අතර, ඔවුන් හට මෙම අඩි ගණන පිටුපසට ගැනීම තුළ ව්‍යාපාරයක් ඉතිරි නොවන බවද මෙය සුවිශේෂී කාරණාවක් ලෙස කමිටුවට යෝජනා කර නගර සීමාව පමණක් නගර සැලසුම්කරණයේ දී නිර්වන්දි ගිවිසුමකට යටත්ව අඩි 33 සීමාව තුළ ඉදි කිරීම් සිදු කිරීමට කමිටුවට යෝජනා කිරීම තමන් මෙහි දී අදහස් කළ බව ද පවසන ලදී.

මේ සම්බන්ධව පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පැවසූවේ අඩි 33 ක සීමාව අනුමත කළ හැකියි යන පදනමේ සිට පාරිභෝගිකයන්ගෙන් සැලසුම් අනුමැතියට භාර ගැනීමෙන් අනතුරුව නිර්වන්දි ගිවිසුමකට මාර්ග සංවර්ධන අධිකාරියට යොමු කරනු ලබන බව ද එහිදී ඔවුන් අඩි 50 ක් තිබිය යුතු බව හා ලංකාවේ සියලුම නගර සඳහා අඩි 50 සීමාව සලකනු ලබන බව වාචිකව පවසා ඇති බවයි. ඉන්පසුව පාරිභෝගිකයන් තමන්ගේ අනුමත වූ සැලැස්ම ලබා ගැනීමට අප ආයතනයට පැමිණෙන අවස්ථාවේ දී අඩි 33 ට නිර්වන්දි ගිවිසුම් ලබා නොදන බවත් අඩි 50ක් තිබිය යුතු බවත් පැහැදිලි කිරීමෙන් අනතුරුව ඔවුන් මාර්ග සංවර්ධන අධිකාරියට ගොස් ඒ සම්බන්ධව විමසන අතර, එම විමසීමේ දී අඩි 33 ට ලබා දිය හැකි බවට එම ආයතනය පවසන නිසා බළන්ගොඩ නගර සභාව වැරදිකාරයො බවට පත් වෙන බව ද මේ හේතුව නිසා මාර්ග සංවර්ධන අධිකාරිය පවසන ආකාරයට ලංකාව තුළම ක්‍රියාත්මක වන බව යැයි පවසන එම නීතිමය ලියවිල්ලෙහි පිටපතක් අප වෙත ලබා දෙන ලෙස තමන් මෙම කමිටුවේ දී ඉල්ලූ බව ද එය පාරිභෝගිකයන්ට ලබා දීමෙන් මහජනතාව සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වන නගර සභාව අපහසුතාවයට පත් වීම වැළැක්වීමට හැකි බව ද වැඩිදුරටත් සභාපතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා නැවත වරක් අදහස් දක්වමින් පැවසුවේ මෙය ජාතික ප්‍රශ්නයක් බැවින් මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරුතුමා හට මේ සම්බන්ධව සම්බන්ධීකරණ කමිටුවේ දී තීන්දුවක් ගැනීමට නොහැකි බව පැවසූ බවයි. එමෙන්ම බළන්ගොඩ නගර සීමාවට පමණක් විකල්ප මාර්ග දෙකක් පවතින බැවින් එම සුවිශේෂී කාරණාව සැලකිල්ලට ගෙන බළන්ගොඩ නගර සීමාවට පමණක් සැලසුම් අනුමැතියේ දී අඩි 33 සීමාව අනුමත කරන ලෙස කමිටුවට ඉල්ලීමක් කිරීම සුදුසු බව පවසන ලදී.

ගරු උප සභාපති එම්. ටී, එම්. රූමි මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභාවට විකල්ප මාර්ග දෙකක් තිබුණ ද ඇතැම් නගරවලට එම අවස්ථාව නොමැති බැවින් විශේෂ අනුමැතියක් ගැනීමට කටයුතු කළ යුතු බව පැවසීය.

මෙහි දී අනුමැතිය ලබා ගැනීම සඳහා ඉල්ලීමක් සිදු කරමු යි ගරු සභාපතිතුමා පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා දෙවන යෝජනාව වශයෙන් ඉදිරිපත් කළ සේනක සෙන්ස් ආයතනය ඇගයීමට ලක් කිරීම සම්බන්ධව අදහස් දක්වමින් පැවසුවේ කොවිඩ් 19 වසංගත තත්ත්වයේ දෙවන හා තුන්වන රැලි හමුවේ සේනක සෙන් ආයතනය 360 ක් පමණ වූ කාර්ය මණ්ඩලයක් නඩත්තු කරමින් මනා කළමනාකාරිත්වයෙන් යුක්තව කර්මාන්තශාලාව පවත්වාගෙන යන බවයි. ඒ අනුව එන්නත්කරණය කරන තෙක් සියලුම සේවකයන් ආරක්ෂා කර ගනිමින් කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන ගිය බව ද බළන්ගොඩ ඇඟලුම් කර්මාන්තශාලා දෙකක කොවිඩ් ආසාධිතයන් අධික ලෙස වාර්තා වුණු කාල සීමාවක කිසිදු ආසාධිතයෙකු තම කර්මාන්තශාලාවෙන් වාර්තා නොවීම සඳහා ආරක්ෂිත ක්‍රියාමාර්ග කිහිපයක් එතුමා අනුගමනය කර තිබුණු බව ද විශේෂයෙන් ඇඟලුම් කර්මාන්තශාලාවේ සේවය කරන සේවිකාවන්ගේ ස්වාමිපුරුෂයන් 28 දෙනෙක් වැටුප් සහිතව මාස දෙකක කාලයක් නිවස්වල තැබීමට කටයුතු කළ බවද එන්නත්කරණයෙන් පසුව වුවද සියලු දෙනාටම බී 01 නමින් ලාංඡනයක් ලබා දී ඇති අතර, කර්මාන්තශාලාවේ දී හඳුන්වන්නේ ඒ නමින් බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා මේ ක්‍රියාදාමය හේතුවෙන් කිසිදු ආසාධිතයෙකුගෙන් තොරව ආසාධිත ව්‍යාප්තියන් වළක්වමින් පවත්වාගෙන ආ ලංකාවේ එකම කර්මාන්තශාලාව බවට සේනක සෙන් ආයතනය පත් වූ බව ද මේ සම්බන්ධව යුධ හමුදාපතිතුමා පවා විශේෂ ඇගයීමක් කළ බව ද පවසන ලදී.

එබැවින් ගරු සභාවේ මේ සම්බන්ධව සාකච්ඡා කර ඇගයීම් ලිපියක් සේනක සෙන් ආයතනය වෙත ලබා දීමට තමන් යෝජනා කරන බව පවසන ලදී.

මෙහි දී අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය පැවසුවේ සේනක සෙන් ආයතනය පමණක් නොව ඒ ආකාරයට කොරෝනා වසංගතයෙන් සේවකයන් හා ජනතාව ආරක්ෂා කරගනිමින් කටයුතු කළ තවත් ආයතන පවතින බැවින් ඔවුන්ව ද ඇගයීමට ලක් කළ යුතු බවයි.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් ආයතනයන් ගැන නම් කිරීමක් නැති නිසා ලිඛිතව ඇගයීමක් කළ නොහැකි බැවින් පොදුවේ සභාවේ ඇගයීමක් එම සියලු ආයතන වෙත සිදු කිරීම සුදුසු බව පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් රත්නපුර දිස්ත්‍රික්කයේ 88% ක් ඉක්මවමින් එන්නත්කරණය සිදු වූ අතර, එන්නතේ දෙවන මාත්‍රාව ද ගෙන දින 30ක් යනතුරු රුධිරය පරිත්‍යාග කිරීම නොකළ යුතු බැවින් වර්තමානයේ උග්‍ර ලේ හිඟයක් පවතින බව ද අපගේ කාර්ය මණ්ඩලය හා ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය දෙවන මාත්‍රාව ලබා ගෙන මාසයක් ඉක්මවා ඇති බැවින් සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන් අනුගමනය කරමින් ලේ දන් දීමේ කඳවුරක් සංවිධානය කර එයට දායක වීමට හැකි නම් ඉතා වටිනා බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:03 ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

08:03:01 බළන්ගොඩ, මිරිස්වත්ත, සුබයිර් අලීම් මාවත ආරම්භක කොටස තාර දමා සංවර්ධනය කිරීම සම්බන්ධව ස්තුතිය පුද කරන අතර, මෙම පාරේ ඉතිරි කොටස තාර දමා සංවර්ධනය කර නිම කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා, බළන්ගොඩ, මිරිස්වත්ත, සුබයිර් අලීම් මාවත ආරම්භක කොටස තාර දමා සංවර්ධනය කර ඇති අතර, අඩි 100 ක් පමණ වන කුඩා කොටසක් සංවර්ධනය කිරීමට ඉතිරිව පවතින බැවින් එම කොටස ද නගර සභාවට අයත්ව ඇති තවත් අතුරු මාර්ගයක් පවතින අතර එය සංවර්ධනය කර දෙන ලෙස ද පවසන ලදී.

මේ සම්බන්ධව කාර්මික නිලධාරීතුමාගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08:04 ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

08:04:01 ඉවත් කර ඇති ලයිට් කණු මාර්ගයේ තැනින් තැන පවතින අතර, එම කණු ලබා ගැනීමට හැකියාවක් පවතී දැයි නිරන්තරයෙන් ජනතාවගේ විමසුම් ලැබෙන බැවින් එම කණු ලබා දීමට හැකි නම් ඒ සඳහා කටයුතු කිරීම

08:04:02 බළන්ගොඩ නගර වසම එකමුතු ජොෂ්ඨ පුරවැසි සංවිධානය වෙත රැඳවුම් මුදල් හා කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැන්පත් මුදල් ආපසු ලබා ගැනීම

08:04:03 කර්මාන්ත කමිටුව විසින් නිර්දේශිත යෝජනා

I. උඩකන්ද පාර දෙපැත්ත කාණුව සංවර්ධනය කිරීම
II. උඩකන්ද, ගල්වල පාර ,කොටුගොඩැල්ල පාර විදුලි පහන් සවිකිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය, ලයිට් කණු සම්බන්ධව ගැටලුව ගරු සභාපතිතුමාට මීට පෙර දැනුම් දුන් අවස්ථාවේ කළ යුතු ක්‍රමවේදය පිළිබඳව දැනුවත් කළ ද තමන් ගරු සභාවට මෙම කරුණ ඉදිරිපත් කිරීමෙන් අපේක්ෂා කරනු ලැබුවේ ගරු සභාව දැනුවත් කර ඒ මඟින් ලිපියක් විදුලි අධිකාරීතුමාට යොමු කිරීම බව පවසන ලදී. එමෙන්ම අලුතින් ලයිට් කණු

එද්දි පැරණි ලයිට් කණු ඒ ඒ තැන්වල දමා ගොස් ඇති අතර, බළන්ගොඩ නගරය අවටම එවැනි කණු 25-30ක් පමණ තිබෙන බව ද ඇතැම් පටු මාර්ගවල නව කණු සිටුවීමේ දී පැරණි ලයිට් කණුව ද ඉවත් නොකර පැවතීම නිසා මාර්ගයන් අවහිර වී ඇති බව ද වැඩිදුරටත් පවසන ලදී.

මේ සම්බන්ධව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා පැවසුවේ විදුලි අධිකාරීතුමා සමඟ මෙම කරුණ සම්බන්ධව සිදු කළ සාකච්ඡාවේ දී එතුමා සඳහන් කළේ එම කණු දිරල ගියද පුද්ගලිකව ලබා දීමට නොහැකි අතර,එසේ දීම රාජ්‍ය දේපල අවභාවිතා වීමක් වන බැවින් නීතිමය ගැටලු ඇති වන බවයි. එබැවින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා දැනුවත් කර සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීමට හා විදුලි අධිකාරිතුමාට ලිපියක් මඟින් ඉල්ලීමක් කිරීම සුදුසු බව ගරු සභාපතිතුමා පැවසීය.

එමෙන්ම වැඩිදුරටත් අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පැවසුවේ අද දින ලිපියක් ලැබුණු අතර, එහි සඳහන් වී ඇත්තේ විදුලි බල මණ්ඩලය මඟින් ලයිට් කණුවක් සිටුවන්නේ නම් ඒ සඳහා පූර්ව අනුමැතිය අදාල පළාත් පාලන ආයතනයෙන් ලබා ගත යුතු බවයි.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා, බළන්ගොඩ නගර වසම එකමුතු ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානය වෙත රැඳවුම් මුදල් හා කොන්ත්‍රාත් ගිවිසුම් ඇප තැන්පත් මුදල් ආපසු ලබා ගැනීම නමින් ඉදිරිපත් වී ඇති යෝජනාව පිළිබඳ කරුණු විමසන ලදී.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පැවසුවේ පදිකයන්ට ගමන් කිරීමේ පදනම මත උඩකන්ද පාර කොන්ක්‍රීට් ස්ලැබ් යෙදීමේ ව්‍යාපෘතියෙහි රැඳවුම් ගාස්තු ලබා ගැනීම මෙම යෝජනාව මඟින් ඉල්ලා ඇති බවයි.

නැවත අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා, මෙම ව්‍යාපෘතිය සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්තුමා සිදු කළ පරීක්ෂණයෙන් මුදල් ගෙවීම නතර කරන ලෙස පැවසූ බැවින් නැවත මුදල් ගෙවන ලෙස අනුමැතියක් ලැබුණේ දැයි විමසන ලදී. එමෙන්ම අනුමැතිය ලිඛිතව ලබා දී ඇත්නම් පමණක් මුදල් ගෙවීමේ ගැටලුවක් නොමැති බව වැඩිදුරටත් පවසන ලදී.

මෙහි දී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය, පළාත් සභාව වෙත යොමු කර ඇත්තේ වෙනත් නිවසකට යාමට දැමූ ස්ලැබ් එකක් සම්බන්ධව වන බව ද කාර්මික නිළධාරීතුමා පරීක්ෂා කිරීමෙන් අනතුරුව තවත් පොඩි කාලයක් බලමු යැයි පැවසූ බව ද නමුත් දැනට වසර දෙක හමාරක් ගත වී ඇති අතර කිසිදු ගැටලුවක් ඇති නොවූ බව ද පවසන ලදී.

මේ සම්බන්ධව කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ. ජී පේමදාස මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

අදාල පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්. ටී. එම්. රුමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව පළාත් ඉංජිනේරුතුමාගේ වාර්තාව ලබා ගැනීමටත්, අනුමැතිය ලැබීමෙන් පසු ගෙවීම් සිදු කිරීමත් සුදුසු බව සභාවේ මතය විය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.05. ගරු නාගරික මන්ත්‍රීනී එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය**

08:05:01 කර්මාන්ත කමිටුව විසින් නිර්දේශිත යෝජනා

I. කුමාරගම පිරිවෙන පාර දෙපස අධිකව වල් බිහිවී ඇති බැවින් එය කපා එළිපෙහෙළි කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.06. ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

08:06:01 කර්මාන්ත කමිටුව විසින් නිර්දේශිත යෝජනා

I. හුණුකුඹුර කෝපිවත්ත මාර්ගයේ එන්.අශෝකා පද්මිණි මහත්මියගේ නිවස අසල සිට සරත් රණතුංග මහතාගේ නිවස දක්වා වූ මාර්ගය මීටර් 20 ක පමණ දුරක් ඉන්ටර්ලොක් ගල් අතුරා සංවර්ධනය කිරීම.

II. හුණුකුඹුර ගාලවත්ත මාර්ගයේ පාලම අසල දොරවෙල ඔයට බැසීම සඳහා පඩිපෙල් කීපයක් යොදා සංවර්ධනය කිරීම.

III. සුදර්ශනගම ඉහළ මාර්ගයේ සුමිත් මහතාගේ නිවස ඉදිරිපිට වැසිජල කාණු පද්ධතිය නිසා තමාගේ ඉඩමට හානි සිදුවන බැවින් එම ස්ථානයට හියුම් පයිප්ප ලබාදී කාණුව පිළිසකර කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.07. ගරු නාගරික මන්ත්‍රීනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

08:07:01 කර්මාන්ත කමිටුව විසින් නිර්දේශිත යෝජනා

I. ඇල්ලෙපොල කොට්ඨාශයේ ,ඇල්ලෙපොල මහා විද්‍යාලය ආසන්නයේ සිට රුසිරු ලී මෝල දක්වා ඇති බළන්ගොඩ -රත්නපුර ප්‍රධාන මාර්ගයේ දෙපස කාණු පද්ධතිය ගොඩ වී ඇති අතර, එහි පවිත්‍ර කටයුතු පිළිබඳ අවධානය යොමුකිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**09. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**10. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | **9,218,518.59** |
| වෙනත් ලැබීම් | **2,187,160.34** |
| මුලු ලැබීම් | **11,405,678.93** |
| පුනරාවර්තන වියදම් | **9,494,267.30** |
| වෙනත් වියදම් | **2,281,096.76** |
| මුලු වියදම් | **11,775,364.06** |

2021-07-01 දින සිට 2021-07-31 දක්වා ඉන්ධන වාර්තාව

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 26,307.00 |
| 227-5020 | 51,050.00 |
| RE2600 | 30,089.00 |
| ovm0017 | 4,290.00 |
| MG0014 | 17,871.00 |
| BC-0005 | 50,800.00 |
| QL2901 | 4,867.00 |
| 226-7521 | 25,530.00 |
| LL - 7688 | 6,216.00 |
| RB4786 | 24,045.36 |
| JD 4684 | 3,454.00 |
| GC0001 | 5,495.00 |
| SDRR0013 | 6,660.00 |
| RC1107 | 29,407.20 |
| ND5124 | 41,514.00 |
| PF-4006 | 28,332.00 |
| FP0002 | 1,750.00 |
| RD8240 | 30,199.00 |
| RD 8000 | 6,105.00 |
| LL-2110 | 8,617.00 |
| RC 1118 | 11,978.00 |
| UQ - 1933 | 3,140.00 |
| ZA9835 | 1,650.00 |
| ZA0228 | 3,552.00 |
| ZA 5039 | 58,941.00 |
| DDR 0008 | 1,110.00 |
| **එකතුව** | **452,770.56** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**11. ඇස්තමේන්තු අනුමත කිරීම**

**12. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් මේ වන විට ශ්‍රී ලංකාවේ සාර්ථකව පැය 24 පුරා එන්නත්කරණය සිදුවන බව ද පළවෙනි මාත්‍රාව ලබා ගත් පිරිස කෝටිය ඉක්මවා ඇති අතර, දෙවැනි මාත්‍රාව ලබා ගත් පිරිස ලක්ෂ 30 ඉක්මවා ඇති බවද පවසන ලදී. එමෙන්ම මෙම වසංගත තත්ත්වයෙන් ජනතාව බේරා ගැනීම සඳහා සෞඛ්‍ය නිලධාරීන්, යුධ හමුදාව ඇතුළු සියලු දෙනා දැඩි වෙහෙසක් ගන්නා බව ද ඩෙල්ටා ප්‍රභේදය ඉතාම සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන බැවින් අප සියලු දෙනා මේ අවස්ථාවේ දී පිරිස් වශයෙන් එක්රැස් නොවී රජයට සහය දීම කළ යුතු බව ද වැඩිදුරටත් පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් ශ්‍රී ලංකාවේ මේ වන විට ගමක් ගමක් පාසා කොරෝනා වසංගතය පැතිරී ඇති බව ද ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ඉතා ආඩම්බරයෙන් එන්නත්කරණය ගැන කතා කළ නමුත් අවුරුදු 18-30 ත් අතර පිරිසට තවම මෙම එන්නත් ලබා දී නොමැති බව ද මේ නිසා වයසක පුද්ගලයන් ඉතුරු වී තරුණ දරුවන් මරණයට පත් විය හැකි බැවින් මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කර දුවා දරුවන් බේරාගැනීම සඳහා නිසි වැඩපිළිවෙලක් සකස් කරන ලෙස ද ඇතැම් පිරිස් අවුරුදු 15 දරුවන්ට පවා එන්නත් ලබා දී ඇති බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

මෙහි දී අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා පැවසුවේ සෞඛ්‍ය අංශ සමඟ මේ සම්බන්ධව සාකච්ඡා කර ඇති අතර අගෝස්තු මාසය අවසාන වන විට අවුරුදු 18-30 අතර තරුණ පිරිසට එන්නත්කරණය සිදු කරන බවයි.

**ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් එන්නත්කරණය පිළිබඳව ගරු නාගරික මන්ත්‍රීතුමිය හා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා කතා කළ අතර, එම කොරෝනා වසංගත තත්ත්වයත් සමගම ඩෙංගු අවදානම ද කොට්ඨාසයන් තුල ව්‍යාප්ත වෙමින් පවතින බව ද විශේෂයෙන් ආනන්ද මෛත්‍රී මාවතේ මේ වනවිට අසාධ්‍ය වූ ඩෙංගු රෝගීන් 2-3 ක් වාර්තා වී ඇති බව ද මේ නිසා කොට්ඨාස මට්ටමින් ධූමායනය සිදු කරන්නේ නම් හොඳ යැයි ගම්වාසීන් තමන්ට පැවසූ බව ද ඒ අනුව මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා සමඟ තමන් මේ සම්බන්ධව කතා කළ අතර, ඩෙංගු රෝගීන් වාර්තා වීම පිළිබඳ වෛද්‍ය නිලධාරී නිර්දේශය ඒ සඳහා අවශ්‍ය බවට එතුමා පැවසූ බව ද සඳහන් කරන ලදී. මේ නිසා වෛද්‍ය නිර්දේශය ලැබෙන තෙක් නොසිට හඳුනාගත් මදුරුවන් බෝවන ස්ථාන සඳහා කොට්ඨාස මට්ටමින් ධූමායනය සිදු කරන ලෙස ගරු සභාවට තමන් යෝජනා කරන බව වැඩිදුරටත් පැවසීය.

මේ සම්බන්ධව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා, තමන් දන්නා ආකාරයට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයට ඩෙංගු රෝගීන් සිටින බවට වාර්තා විය යුතු අතර, ඒ අනුව ඔවුන් ක්‍රියාත්මක වන බව ද ධූමායනය මගින් පරිසරයේ සිටින සියලුම කෘමීන් විනාශ වන බැවින් ධූමායනයට යොමු නොවී ප්‍රජාවත් සමග එකතු වී අවශ්‍ය පිරිසිදු කර ගැනීම් සිදු කිරීම කළ යුතු බව ද අනෙකුත් සතුන්ට හානියක් නොවන පරිදි කළ හැකි වැඩසටහනක් හෝ ක්‍රමවේදයකට යා යුතු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී පී. චන්ද්‍රලතා මැතිතුමිය නැවත අදහස් දක්වමින් පසුගිය සභාවේ දී පෙර පාසල් පාලිකා බඳවා ගැනීම සම්බන්ධව සභාවේ විශාල කාල වේලාවක් වැය කිරීම මෙන්ම බහුතරයක් ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා හා තුමියන්ලා ඇයට සාධාරණයක් ඉටු කිරීමට ඉදිරිපත්වීම පිළිබඳව තමන්ගේ ස්තුතිය පිරිනමන බව ද එහි දී ඇයගේ සේවය වෙනුවෙන් තම මන්ත්‍රී දීමනාවෙන් කොටසක් ලබා දීමට නාගරික මන්ත්‍රීතුමන්ලා හා තුමියන්ලා එකඟ වුව ද ඇය එම මුදල් ප්‍රතික්ෂේප කරන බැවින් මන්ත්‍රී දීමනාවෙන් මුදල් නොකපන ලෙසට ඉල්ලා සිටින බවද ඇය සියලුම සුදුසුකම් සපුරා අවුරුදු එක හමාරක කාලයක් තම සේවය බළන්ගොඩ නගර සභාවේ පෙර පාසල් දරුවන් වෙනුවෙන් ලබා දුන් බැවින් මේ සම්බන්ධව සලකා බලා ඉදිරියේ දී යම් කිසි අවස්ථාවක් ලැබුණහොත් ඇය වෙත එම අවස්ථාව ලබා දෙන ලෙස ද ඉල්ලා සිටින ලදී.

මීට අමතරව පීරිස් මහතාගේ නඩුව සම්බන්ධ කතා කිරීමට තමන් මෙහි දී බලාපොරොත්තු වන බව ද ගරු සභාවට අඩි 03ක පාර පවරා ඇති අතර නඩුව යන අතරතුර සභාවෙන් සුද්ධ කර ඇති කොටසේ මෙම පුද්ගලයා නිවසක් කඩපු ගල් කුඩු ගොඩ කර තිබුණු බව ද මේ පිළිබඳව ලේකම්තුමියට පැවසූ අවස්ථාවේ දී එතුමිය අදාල ස්ථානය වෙත නිළධාරියෙක් යවා තිබුණු නමුදු ඔහුට මෙම පුද්ගලයා තමන් නඩුව දිනා ඇති බව පවසා ඇති බව ද පැවසීය. එබැවින් මෙම නඩුව දිනා ඇත්ද නැද්ද යන්න පිළිබඳව

තමන්ට පැහැදිලි කර දෙන ලෙස ද ඔහුට කැමති විදියට මෙසේ නඩුවක් යන අතරතුර එම පාර තමන් සතු කර ගැනීමට ඉඩ ලබා නොදෙන ලෙස ද මෙම ස්ථානයට ජනතාවට ඇතුල්වීමට පවා මොහු ඉඩ නොදන බැවින් නගර සභාවෙන් මේ සම්බන්ධව මැදිහත් වී පියවරක් ගන්නා ලෙස ද මෙම නඩුව පිළිබඳව ගරු සභාපතිතුමාගේ දැඩි අවධානය යොමු කරන ලෙස ද මෙම පාර නැවත වල් බිහිවී ඇති බැවින් සභාව මගින් නැවත සුද්ධ කර දෙන ලෙස ද වැඩිදුරටත් පවසන ලදී.

එමෙන්ම පසුගිය දිනක ගාලෙවත්ත මාර්ගයේ පිරිසක් විසින් ඔබතුමාට ලිපියක් ලබා දීමට සූදානම් වෙද්දී තමන්ට හමු වූ බව ද ගාලෙවත්ත කෙළවරේ තුන්මංහංදියෙහි පාර අයිනෙහි සිටුවා ඇති ලයිට් කණුව හේතුවෙන් ත්‍රිවිල් හැර අනෙකුත් ලොරි රථ වැනි වාහනවලට ගමන් කිරීමට නොහැකි වී ඇති බව ද මෙම කණුව අසල බැම්මක් පවතින අතර එම බැම්මෙන් ඇතුලට කණුව සිටුවීමට එම නිවැසියන් අකමැති බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය, මේ නිසා බැම්මෙන් උඩ කණුව සවි කර දීමට හැකියාවක් ඇත්දැයි සභාවේ සාකච්ඡා කර බලන බවට තමන් එම පිරිසට පැවසූ බව ද සඳහන් කරන ලදී. එබැවින් මේ සම්බන්ධව විදුලි බල මණ්ඩලය සමග සාකච්ඡා කර ඉටු කර දීමට හැකි නම් ඉතා වටිනා බව ද විශේෂයෙන් නිවාස 50 - 60 කට මෙම මාර්ගයෙන් යාමට හැකි බව ද වැඩිදුරටත් පවසන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා පැවසුවේ මේ සඳහා මුලින්ම එම නිවැසියන්ගේ කැමැත්ත ලබා ගන්නා ලෙසයි.

ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය නැවත වරක් තම අදහස් දැක්වීම ආරම්භ කරමින් ඇල්ලෙපොල ප්‍රදේශයේ අනතුරුදායක ගස් දෙකක් සම්බන්ධයෙන් 2020 වර්ෂයේ ජූලි මාසයේ දී බළන්ගොඩ නගර සභාවට දැනුම් දුන් අතර, එයින් එක් ගසක් කපා ඉවත් කළ නමුත් අවුරුද්දකට වැඩි කාලයක් තිස්සේ අනෙක් අනතුරුදායක පොල් ගස පවතින බව ද එම ගස නිසා නිවැසියන්ගේ දේපලවලට හානි සිදු වන අතර, ඉදිරියේ දී පොල් ගෙඩි හා අතු වැටීම නිසා ජීවිතවලට පවා අනතුරු සිදු විය හැකි බව ද පවසන ලදී. මෙම ගස දින 07ක් ඇතුලත් ඉවත් කරන ලෙස 2020 වර්ෂයේ ජූලි මාසයේ දැනුම් දුන්න ද මේ වනතෙක් ඉවත් කර නොමැති බවද නගර සභාවෙන් විමසීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හෙළීමේ බලපත්‍රය ලබා දී නොමැති බැවින් ගස ඉවත් කිරීමට නොහැකි වී ඇති බව පැවසූ බව ද මේ නිසා තමන් ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් මේ පිළිබඳව විමසීමේ දී හෙළීමේ බලපත්‍රය දෙන බවත් ගස ඉවත් කර ගන්නා ලෙසත් එතුමා පැවසූ බව ද එසේ විමසා සතියකට වැඩි කාලයක් ගත වූ නමුත් හෙළීමේ බලපත්‍රය තවම පැමිණ නැති බව විෂය නිලධාරී තමන්ට පැවසූ අතර එය ගෙන්වා ගෙන හැකි ඉක්මනින් මෙම අනතුරුදායක ගස ඉවත් කර දෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් නගර සභාවේ නමට හෙළීමේ බලපත්‍රය ලැබුණු වහාම ගස ඉවත් කරන බව පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් මුගුණමලේ මාර්ගයේ කාණුවේ වැඩ කටයුතු අවුරුදු 02 ක කාලයක් තිස්සේ දවසින් දවස කල් යන බව ද දඹගස ළඟ අඹ ගස තවමත් කපා නොමැති බවද අවසර ගැනීමකින් තොරව වැටවල් ගසා තිබීමේ සිද්ධියක් සම්බන්ධව සභාවට දැනුම් දුන් අතර මේ නිසා පාර ක්‍රමයෙන් කුඩා වී ඇති බවද මෙම සියලු කරුණු සම්බන්ධයෙන් සභාවෙන් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ද පවසන ලදී.

මේ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා පැවසුවේ මෙම අඹ ගස කපා ඉවත් කරන ලෙස තමා වැඩ අධිකාරීතුමාට දැනුම් දුන් අතර මාර්ගයේ නඩත්තු කටයුතු ද ආරම්භ කරන බවයි.

මෙහිදී ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා අදහස් දක්වමින් අනතුරුදායක අඹ ගස ඉවත් කිරීමට පෙර ටෙලිකොම් රැහැන් ඉවත් කිරීමට සිදු වන බැවින් ඒ සම්බන්ධයෙන් ටෙලිකොම් ආයතනය සමඟ තමා කතා කළ බව ද ඔවුන් ලබන සතියේ බළන්ගොඩට පැමිණෙන අතර, ඒ පැමිණි පසු රැහැන් ඉවත් කරන බව තමාට පැවසූ බවද පැවසීය.

නැවත වරක් තම අදහස් දැක්වීම ආරම්භ කළ ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය, ගරු අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමාගේ ඇඳන් 10,000 ව්‍යාපෘතිය මගින් රත්නපුර හා බළන්ගොඩ රෝහල් සඳහා අවශ්‍ය ඇඳන් ලබා ගැනීමටත් ගරු අමාත්‍ය විමල් වීරසිංහ මැතිතුමාගෙන් ICU බෙඩ් ලබා ගැනීමටත් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා මගින් හෝ සභාවක් වශයෙන් ඉල්ලීමක් කරන ලෙස සභාවට යෝජනා කරන බව පැවසීය.

එමෙන්ම ලාෆ් ගෑස් සමාගමේ ගෑස් නොමැති බැවින් එහි තැන්පතුව ඉල්ලා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා වෙත ඉල්ලීමක් කිරීමට තමන් යෝජනා කරන බව වැඩිදුරටත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධව අදහස් දක්වමින් තව ටික දවසකින් එම ගැටලුව නිරාකරණය වන බව පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් කොරෝනා වසංගතය උග්‍රවෙමින් පවතින මොහොතක රජයක් වශයෙන් ගරු ජනාධිපතිතුමා විශාල වැඩ කොටසක් සිදු කරමින් සිටින අතර, එතුමා ජනතාව ගැන සිතන ජනතාවාදී මනුස්සයෙක් බව ද අද වන විට අවුරුදු 60ට ඉහළ පුද්ගලයන් වෙනුවෙන් එන්නත්කරණය අවසන් කර ඇති අතර, අවුරුදු 30 න් ඉහළ පුද්ගලයන්ට එන්නත්කරණය ද මේ වන විට අවසන් වෙමින් පවතින බව ද ඊළඟට ඇත්තේ අවුරුදු 18-30 අතර ජනගහනය බව ද පවසන ලදී. එමෙන්ම එන්නත්කරණය කරන ස්ථානවලට ගිය අවස්ථාවල දී සෞඛ්‍ය කාර්ය මණ්ඩලය හා හමුදා සෞඛ්‍ය අංශයන් ඉතා උනන්දුවෙන් මෙම වැඩසටහන සිදු කරන බව දකින්නට ලැබුණු බව ද හෙට දිනයේ තම කොට්ඨාසයේ තුන්වන අදියරේ එන්නත්කරණය සිදු වන බව ද ලෝකයේම පැතිරී ගෙන යන මෙම වසංගතය පාලනය කිරීම සඳහා එන්නත්කරණ වැඩසටහන සාර්ථකව ඉටු කිරීම සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා ඇතුලු රජයට ගෞරවනීය ස්තුතිය පළ කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් පසුගිය කාලයේ කරව්කැටිය ප්‍රදේශයේ පැවති ගැටලු රැසක් කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කළ පසුව කර්මාන්ත කමිටුවේ ගරු සභාපතිතුමා මූලික වී එම ගැටලු විසඳා දුන් බැවින් ඒ සම්බන්ධව ගරු සභාපතිතුමා හා කර්මාන්ත කමිටුවේ සභාපතිතුමා වෙත මෙන්ම පක්ෂ භේදයකින් තොරව උදව් කළ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාට ද වැඩ අධිකාරී හා කාර්මික නිලධාරීතුමාට ද තම ස්තුතිය පළ කරන බව පවසන ලදී. එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා නිරන්තරයෙන් ගල්වල පාරේ අඩුපාඩු කිහිපයක් ගැන පවසන බැවින් එම අඩුපාඩු සකස් කර දෙන ලෙස ද කසළ එකතු කිරීමට නොපැමිණෙන බව එම ප්‍රදේශවාසීන් මෙන්ම උඩකන්ද පාර ප්‍රදේශවාසීන් පවසන අතර මේ සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලෙස ද සී. සී. දෙමළ විද්‍යාල පාර සුද්ධ කර නැති බැවින් එය ඉටු කරන ලෙස ද ඉල්ලා සිටින ලදී.

මෙහි දී අදහස් දැක් වූ ගරු සභාපතිතුමා සී. සී. දෙමළ විද්‍යාල පාරෙහි ජල සම්පාදන මණ්ඩලයේ ජල නල එලා ඇත්තේ පාරෙහි මතුපිටට වන්නට බැවින් ක්‍රමවත්ව ජල නල එලන ලෙස ජල සම්පාදන මණ්ඩලයට ලිපියක් ඉදිරිපත් කරන මෙන් වැඩ අධිකාරීතුමාට පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් ඉදිරියේ දී මෙම මාර්ගය සඳහා කාපට් ව්‍යාපෘතියක් පැමිණෙන බැවින් ක්‍රමවත්ව ජල නල එලා තිබීම ඒ සඳහා අවශ්‍ය වන බව පැවසීය.

නැවත වරක් අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය බළන්ගොඩ නගර සභා යහ සාධක සංගමය මගින් එහි සාමාජිකයන්ට මරණයක දී ගෙවනු ලබන රුපියල් 50,000.00 මුදලට තවත් රු.25,000.00 ක් වැඩි කර ලබා දීමට හැකියාවක් ඇත්නම් එය ඉතා වටිනා බව ද කම්කරු සේවකයන් මාස්ක් නොපළඳින බව තමන් දුටු අතර, ඔවුන්ගේ මුදල් අගහිගකම ඊට හේතුව වන බැවින් මාස්ක් ලබා දීමේ ක්‍රමවේදයක් සභාවෙන් කළ හැකිදැයි විමසන ලදී.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා පැවසුවේ සභාවේ වැඩ කරන සියලුම දෙනාට මාස්ක් ලබා දෙන නමුත් ටෙන්ඩර් ලබා දී ඇති සේවා සඳහා අදාල ටෙන්ඩර්කරු එම පහසුකම් සැලසිය යුතු බවයි.

ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූ පරිදි සේනක සෙත් ආයතනයේ අධිපති සේනක ගුරුසිංහ මහතා එදා සිටම බළන්ගොඩට කීර්තියක් රැගෙන ආ දක්ෂ ව්‍යවසායකයෙක් බවද කොරෝනා වසංගත තත්ත්වය මත පන්සල් සඳහා මෙන්ම නිරෝධායනය වන සෑම නිවසකටම අවශ්‍ය ආහාර ද්‍රව්‍ය අඩංගු බඩු මලු ලබා දීම එතුමා විසින් සිදු කරන අතර එහි දී කුමන කොට්ඨාසයක පුද්ගලයන් දැයි නොසොයන බව ද එම කැපවීම වෙනුවෙන් ඇගයීමකට ලක් කර ලිපියක් යොමු කිරීම සිදු කරන ලෙස තමන් ද ඉල්ලා සිටින අතර, එතුමා ජීවත්වන චෙක්නෝල් පාර අබලන් තත්ත්වයේ පවතින බැවින් ඉදිරියේ දී කර්මාන්ත කමිටුවට යොමු කර අවශ්‍ය සංවර්ධනය සිදු කිරීමට බලාපොරොත්තු වන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය පැවසූ ගරු අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමාගේ ඇඳන් 10,000 ව්‍යාපෘතියෙන් ඇඳන් ලබා ගැනීම හා ICU ඇඳන් ලබා ගැනීම සම්බන්ධව අදහසක් දැක්වීමට තමන් මෙහි දී බලාපොරොත්තු වන බව පැවසීය. ඒ අනුව බළන්ගොඩ මූලික රෝහලේ ඉඩකඩ සීමිත වී ඇති බැවින් ලක්ෂ 800 ක හා ලක්ෂ 550 ක වියදමින් ගොඩනැගිලි දෙකක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඇති බව ද එම ඉදි කිරීම් කටයුතු අවසන් වූ වහාම අවශ්‍ය පහසුකම් සලසන බව ද ICU ඇඳන් මේ මොහොතේ ගෙනත් තැබීමට ඉඩකඩක් රෝහලේ නොමැති බව ද පවසන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ලාෆ් ගෑස් තැන්පතුව ඉල්ලා ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධීකරණ කමිටුවට යොමු කරන ලෙස ද එය ඉතා හොඳ යෝජනාවක් බැවින් එහි දී ඒ සම්බන්ධව සාකච්ඡා කර තැන්පතුව නිදහස් කර ගැනීමට අවශ්‍ය කටයුතු කරමු යි හා එන්නත්කරණ වැඩසටහන් සඳහා අවශ්‍ය සහයෝගයන් ලබා දීම පිළිබඳව ගරු සභාපතිතුමාට ස්තුතිවන්ත වන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් බළන්ගොඩ නගරයේ අඩුපාඩු පෙන්වා ඒවා සකස් කර ගැනීම සඳහා අපි සියලු දෙනා සහෝදරත්වයෙන් කටයුතු කළ යුතු අතර, සභාවක් වශයෙන් ගරු ඇමතිතුමාට යොමු කිරීමේ චේතනාවෙන් ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් යෝජනාවක් ගෙන ආ බැවින් ගැටුම් ඇති කරවන වචන නොකියා ඉවසිලිවන්තව කටයුතු කරන ලෙස ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගෙන් තමන් ඉල්ලා සිටින බව පැවසීය.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් සඳුන්ගම මාර්ගයේ ඉහළ කොටසේ කම්කරු සේවයේ නිරත දුප්පත් ජනතාවක් සිටින බව ද ජලය ලබා දීම සඳහා ජල සම්පාදන මණ්ඩලයෙන් Visibility පරීක්ෂාවක් සිදු කර අහිංසක දුප්පත් ජනතාවගෙන් රුපියල් 18,000.00 - රු.20,000.00 වැනි මුදලක් ලබා ගෙන ජල සම්බන්ධතාවය ලබා දී ඇති නමුත් ජලය නොලැබෙන බව ද ඒ සම්බන්ධව පසුගිය දිනක ජල සම්පාදන මණ්ඩලයට පැවසූ විට පසු දිනම ජලය ලබා දුන් අතර ජලය නොමැති නම් එසේ දිය නොහැකි බව ද සඳහන් කළ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා, දැනට මාස දෙකක පමණ කාලයක් තිස්සේ එම ජනතාවට වතුර නොමැති බව ද එබැවින් මේ පිළිබඳව සියලුම ගරු නාගරික මන්ත්‍රීවරුන් අවධානය යොමු කර සභාවක් වශයෙන් මෙම අසරණ

මිනිසුන්ට වචනකින් හෝ උදව්වක් උපකාරයක් කරන ලෙස තමන් ඉල්ලා සිටින බවද මෙම ජනතාවට නගර සභාවෙන් කිසිදු සේවාවක් නොලැබී ඇති බව ද පවසන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ගරු අමාත්‍ය නාමල් රාජපක්ෂ මැතිතුමාගේ ඇඳන් 10,000 ව්‍යාපෘතියෙන් ඇඳන් ලබා ගමු යැයි යෝජනා කළ ද ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමන් විසින් වටවල හා කිංචිගුණේ ඇති කරනු ලැබූ කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානවල පවතින ඇඳන්වල නිෂ්පාදනය කල පුද්ගලයා සටහන් නොවුන ද ඒවා රජයෙන් ලබා දුන් ඇඳන් බව ද විශේෂයෙන් කිංචිගුණේ මධ්‍යස්ථානයේ ඇඳන් 240ක් පවතින බව ද පැවසීය. එබැවින් බංකොලොත් දේශපාලනය කරන ඇතැම් අය විවිධ දේ පැවසුව ද තමන් ආණ්ඩුව විවේචනය කරන්න ඕන තැන දි විවේචනය කරන බව ද පසුගිය සභාවේ දි තමන් විසින් මාර්ග සංවර්ධනය සම්බන්ධව එලෙස විවේචනය කරන ලද බව ද ලෝකයේ එන්නත්කරණ ක්‍රියාවලියේ දී ශ්‍රී ලංකාව ඉදිරියෙන් සිටින බවද පවසන ලදී.

එමෙන්ම අවුරුදු 73 ක් ආණ්ඩු කළ ද මාසයක් රට වහල මිනිස්සුන්ට කන්න දෙන බැරි තත්ත්වයේ ආණ්ඩු ඇති වී තිබෙන බව ද කොරෝනා හේතුවෙන් අද වන විට 5400 ක් මිය ගිහින් තිබෙන අතර ඉන් 1600 ක් මුස්ලිම් ජනතාව වන බව ද 90% ක් එන්නත් නොකළ අය වන අතර කොරෝනා වැළඳුන මුස්ලිම් ජනතාවගෙන් 5% ක් දෙනා මිය යන බව ද මෙය ඉතා බරපතල තත්ත්වයක් බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා, ලෝකයේ අවුරුදු 60 ට වැඩි අය 73% ක් පමණ ද අවුරුදු 30 - 60 ත් අතර 13% ක් පමණ ද අවුරුදු 30ට අඩු 1% ක් පමණ ද වශයෙන් මියගොස් ඇති අතර, ලෝක සෞඛ්‍ය සංවිධානය වැනි ආයතනවල නිර්දේශ, මත විමසා බලා ජාතික මට්ටමේ විවිධ පර්යේෂකයන් හා විද්‍යාඥවරුන් මේ සඳහා අවශ්‍ය මඟපෙන්වීම සිදු කරන බව ද ධනවත් රටක් නොවුන ද රජයක් වශයෙන් එන්නත්කරණයේ දී කළ හැකි උපරිමය සිදු කරන බව ද විශේෂයෙන් අද උදේ අතිගරු ජනාධිපතිතුමන් විසින් තුන්වෙනි එන්නත වශයෙන් පවතින බූස්ටර් නැමැති එන්නත අවශ්‍ය නම් ගෙන්වන ලෙස ගරු අමාත්‍ය චන්න ජයසුමන මැතිතුමාට පැවසුව බව ද ආණ්ඩුවේ යම් යම් අඩුපාඩුකම් පැවතිය හැකි නමුත් නොපෙනෙන වෛරසයකින් අපේ ජනතාව බේරා ගැනීම සඳහා කළ හැකි උපරිම මැදිහත්වීම සහ සාධාරණය රජය විසින් කර ඇති බව ද වැඩිදුරටත් පවසන ලදී.

එමෙන්ම ඉදිරි තත්ත්වය භයානක විය හැකි අතර අපේ කවුරු අභිමි වෙයිදැයි අවිනිශ්චිත බව ද අප නොදැනුවත්ව අපගේ ශරීරයේ වෛරසය තිබී එන්නත්කරණය සිදු කළහොත් කුමක් සිදුවේ දැයි තමන් පසුගිය සම්බන්ධීකරණ කමිටුවේ දී සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලයේ වෛද්‍යතුමාගෙන් විමසූ අතර, එසේ වුවහොත් එය අවදානම් බව එතුමා පැවසුව බව ද ඉන් දවස් දෙකකට පසුව කනගනායගම් එන්නත්කරණ මධ්‍යස්ථානයේ දී ආසාධිත බව නොදැන සිටි අවුරුදු 62 ක කාන්තාවක් එන්නත් කළ පසුව වමනය සමඟ ඇද වැටුණු අතර දවස් දෙකකට පසු මිය ගිය බව ද ඇයගේ ස්වාමි පුරුෂයා අද උදේ මිය ගිය බවද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා, පසුගිය දිනක ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා සහ නාගරික මන්ත්‍රී ඊ.ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් කළ ඉල්ලීම් අනුව ග්‍රාම නිලධාරී වසම නොබලා එන්නත් ලබා දුන් බව ද එය සොරකමක් නොවන අතර තව එන්නත් අවශ්‍ය අය සිටීනම් පවසන ලෙස ද දේශපාලනය කුමක් වුවත් එන්නත්කරණයේ දී අප සියලු දෙනා සහයෝගයෙන් කටයුතු කළ යුතු බව ද අවදානම් මධ්‍යයේ වුවත් නගර සභාවේ නිලධාරී මණ්ඩලය අපගේ වැඩ කටයුතුවල දී සාධාරණය ඉටු කර දී ඇති අතර අඩුපාඩු නොමැතිව ඒවා නිවැරදිව කර ගැනීමට හැකි වාතාවරණයක් ඉදිරියේ දී ඉෂ්ඨ වේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ. එම්.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ. එම්.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් කොරෝනා වසංගතය අද ලංකාවේ පමණක් නොව මුළු ලෝකයේම ව්‍යාප්ත වී ඇති අතර, ආර්ථික හා සමාජීය වශයෙන් පමණක් නොව සෑම අංශයකටම දැඩි බලපෑම් එල්ල කර ඇති බව ද එහි දී පක්ෂ පාට භේදයක් හෝ ධනවත් දුප්පත් භේදයක් නොමැතිව සියලු දෙනාටම එක සේ බලපෑමක් ඇති කර ඇති බව ද බුදු දහම සත්‍ය බව අද පැහැදිලි වී ඇති බව ද පැවසීය. එබැවින් අප සියලු දෙනා පක්ෂ ආගම් භේද නොමැතිව එකතු වී මෙම වසංගතයෙන් අපේ රට බේරා ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු බව ද කාට හෝ ආණ්ඩුවක් කිරීමට රටක් හා ජනතාවක් සිටිය යුතු බව ද මෙම වසංගතයෙන් මිදීමට ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමට හා එන්නත්කරණය සාර්ථක කර ගැනීමට අපගේ සියලු මන්ත්‍රීවරුන්ගේ

සහයෝගය අපේක්ෂා කරන බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ඊ. එම්.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා, නාගරික මන්ත්‍රීවරුන් පමණක් නොව නිළධාරීන් ද විශාල කැපකිරීමක් මේ සඳහා දක්වන අතර, තම ධනය වියදම් කර ආහාර පාන සැපයීම ආදි දේ සිදු කරන බවද ඇතැම් පුද්ගලයන්ගේ අනුග්‍රහයන් ලැබෙන බව ද ඒ සියලුම දෙනාට මෙම අවස්ථාවේ තම ස්තුතිය පළ කරන බවද විශේෂයෙන් ගරු සභාපතිතුමා අවශ්‍ය සෑම අවස්ථාවක දීම උපරිම සහයෝගය ලබා දෙන අතර එතුමාට මෙන්ම සෞඛ්‍ය අංශයේ කැපවීම සම්බන්ධව එම සේවකයන්ට ද තම ස්තුතිය පළ කරන බව පැවසීය.

එමෙන්ම අප රටෙන් මෙම කොරෝනා වසංගතය තුරන් කිරීමට සියලු දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් සියලු දෙනාටම සුභ අනාගතයක් වේවා යි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමාගේ සම්පූර්ණ අනුමැතිය ඇතිව පොළ භූමියේ සියලුම දෙනා සඳහා විදුලිය ලබා දුන්න ද දින කිහිපයකට පෙර නගර සභාවේ නිළධාරියෙක් වන ශාන්ත යන අය විසින් තමාගෙන් අහන්නේ නැතිව ලාල් මන්ත්‍රීතුමා කොහොම ද විදුලිය ලබා දෙන්නේ යැයි පවසමින් වයර් ආදිය ගලවා ඇති බව ද ඉතා සද්භාවයෙන් වැඩක් කරන විට එය අවුල් කරන එම පුද්ගලයා සම්බන්ධව අවශ්‍ය පියවර ගන්නා ලෙස ද පවසන ලදී.

මෙහි දී ගරුසභාපතිතුමා පැවසුවේ මේ සම්බන්ධව කරුණු විමසා අදාල නිළධාරියා හට විනය ක්‍රියාමාර්ග ගන්නා බවයි.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් මහජන පොළේ එළවලු වෙළෙන්දන් එළවලු සේදීම සඳහා ඇවිදින මංතීරුව සකස් කරන ස්ථානයෙන් ගඟට බසින බවත්, එය නීති විරෝධී වුව ද ඇවිදින මංතීරුව සෑදූ පසු එළවලු සේදීමට නොහැකි වන බැවින් ඔවුන් සඳහා පොළ භූමියේ ජල කරාමයක් සකස් කර එළවලු සේදීමට අවශ්‍ය පහසුව සලසා දීමට තමන් යෝජනා කරන බව ද ගලි 04 ක් සහිත කාණුවක් පවතින බවද පොළ භූමියේ නාට්ටම්මිලා පළඳින මාස්ක් ඉතා අපිරිසිදු තත්ත්වයේ පවතින බැවින් ඔවුන්ට මාස්ක් ලබා දීමට හැකියාවක් පවතී නම් එය ලබා දෙන ලෙස ද වැඩිදුරටත් පැවසීය.

එමෙන්ම ගස් කැපීමේ ක්‍රමවේදය අපැහැදිලි බව ද තමන් විසින් සේනක පෙදෙසේ අලුතින් සකස් කරන ලද මාර්ගයේ සපුගසක් හා පොල් ගසක් පවතින අතර එය ඉවත් කර ගැනීමට තවමත් නොහැකි වී ඇති බව ද එම මාර්ගය කොන්ක්‍රීට් කිරීමට මේ වන විට ඉල්ලීම් සිදු කර ඇති නිසා මෙම ගස් ඉවත් කිරීමට අවශ්‍ය බව ද පවසන ලදී.

ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් පැවසුවේ එම මාර්ගයේ සංවර්ධන කටයුතු සිදු වන බැවින් අදාල ගස් ඉවත් කර ගැනීමට අවශ්‍ය බව දන්වමින් ප්‍රාදේශීය ලේකම්තුමා වෙත ලිපියක් ලබා දී හෙලීමේ බලපත්‍රය ලබා ගන්නා ලෙසයි.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් නව බස් නැවතුම්පළ කාර්මික සේවය පවතින ස්ථානයේ විවේක කාමරයක් නොමැති නමුත් සෙවන ලබා දෙන අඹ ගසක් තිබෙන බව ද එම අඹ ගස යට ගල් බංකු කිහිපයක් තබා ලස්සනට සකස් කළ හැකි නම් ඉතා වටිනා බව ද එම ස්ථානයේ වැසිකිළියක් පවතින නමුත් එහි කොමඩ් එක කැඩී ඇති අතර රියදුරන්, කොන්දොස්තරවරුන් හා කාර්මික සේවයේ නියුතු පුද්ගලයන්ගේ භාවිතය සඳහා පමණක් වන ලෙස එම වැසිකිළිය අලුත්වැඩියා කර ලබා දෙන ලෙස ද එම ස්ථානය දුර ගමන් සේවා බස් රථ නවතා තබන ස්ථානයක් බැවින් වාහන වෙන්වන ලෙස සුදු ඉරි ඇඳ දුනහොත් එහි පිළිවෙලක් පවතින බව ද පවසන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ නව සංකල්පයකට අනුව කාපට් පාරවල් නිර්මාණය කරන අතර, මේ නිසා පළාත් පාලන ආයතන වශයෙන් අපට යම් වාසියක් හිමි වෙන බව ද විශේෂයෙන් නඩත්තු කටයුතු අඩු විය හැකි බව ද අවුරුද්දකට පෙර මාසෙකට භාවිත කළ තාර බැරල් ප්‍රමාණය හා අද වන විට මාසෙකට භාවිතා කරන තාර බැරල් ප්‍රමාණය අතර වෙනසක් පවතින්නේ දැයි විමසන බව ද කරව්කැටිය සඳහා අප

පක්ෂයේ මන්ත්‍රී කෙනෙක් නොමැති බැවින් එම ප්‍රදේශය සම්බන්ධව තමන් සොයා බලා අවශ්‍ය කටයුතු කරන බවද ඒ අනුව ඉදිරියේ දී එහි පාරවල් 05 ක් කාපට් කිරීම සඳහා කටයුතු සූදානම් කර පවතින බව ද වැඩිදුරටත් පැවසීය.

මෙහිදී ගරු සභාපතිතුමා පැවසුවේ සියලුම නඩත්තු සම්බන්ධයෙන් මාසිකව සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා අතර තාර බැරල් ප්‍රමාණයේ ලොකු වෙනසක් තවම ඇති වී නොමැති බවයි.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් සුනඛ ගැටලුව සම්බන්ධයෙන් පළාත් පාලන ආයතනයක් වශයෙන් අප හට වගකීමක් ඇති බව ද පසුගිය දිනක මහත් වෙහෙසක් දරා ජලභීතිකා රෝගය වැළඳුනු සුනඛයෙක් අල්ලා ගත් බව ද ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා පෙර දිනයේ පැවති රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ දී මේ සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කර ඇති බව ද ඒ අනුව එහි කර්තව්‍ය පළාත් පාලන ආයතනවලට පැවරිය හැකි බව ද පවසන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා, පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මඟින් අයාලේ යන සුනඛයින් එන්නත් කිරීමේ කටයුතු සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන වෙත උපදෙස් ලබා දී ඇති අතර ඊකියා දඟ ලක්ෂය සඳහා බඳවා ගත් අයගෙන් දෙදෙනෙක් මේ වෙනුවෙන් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බව ද ස්වේච්ඡා සංවිධාන වැනි විවිධ සංවිධාන අයිතිවාසිකම් ඉල්ලා හඬ නැගුව ද අයාලේ යන සුනඛයන් හේතුවෙන් ජලභීතිකාව වැළඳුනහොත් අනිවාර්යෙන්ම මරණයට පත් වෙන බවද සුනඛයන් සපා කෑම වෙනුවෙන් ලබා දෙන එන්නත් සඳහා ලක්ෂ ගණනක වියදමක් යන බව ද LRT ක්‍රියාවලිය සාර්ථක නැති බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුවේ LRT ක්‍රියාවලිය සාර්ථක නමුත් නිවෙස්වල ඇති කරන සුනඛයන් හට පැටව් ලැබුණු පසු එම පැටව් මහ මඟට ගෙනත් දැමීම නිසා අයාලේ යන සුනඛ ගහනය වැඩි වී ඇති බවයි.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා නැවත අදහස් දක්වමින් මොහාන් සාලිය එල්ලාවල මාවතේ ඇති උල්පත් ජලය සහිත ජල කරාමය මඟින් ඈත ප්‍රදේශවල සිට ගමන් කරන පිරිස් පවා ජලය ලබා ගන්නා බැවින් එම ස්ථානය ක්‍රමවත්ව සකස් කර තවත් ජල කරාම 05 ක් වත් යෙදීම සුදුසු බව ද මීට ඉහත දිනක දී ඩයලොග් කණු සම්බන්ධව තමන් කළ යෝජනාව අනුව නිළධාරියෙකු පැමිණි නමුත් තමන්ට ඔහු මුණ නොගැසුණු බව ද එහි දී කණු අඩු කර ගැනීමට පුලුවන් ක්‍රමයක් පවතින බවට සඳහන් කර ඇති බව දැනගන්නට ලැබුණු බව ද අවසාන වශයෙන් අසනීප තත්ත්වයේ සිටින ලේකම්තුමියගේ සැමියා හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

මෙහි දී ගරු සභාපතිතුමා අදහස් දක්වමින් අවශ්‍ය උපදෙස් ලබා දී එම ස්ථානය සුද්ධ කර ඉදිරි කටයුතු සිදු කරන ලෙස ද ජල ටැංකියක් මඟින් ලබා දීමට සිදු වන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා පැවසුවේ වැල් මඟින් ජලය නවතා තැබීමෙන් ජල උල්පත වෙනත් පැත්තකට යා හැකි බවයි.

**13. අවසානය**

මෙම කොරෝනා වසංගත තත්ත්වය හමුවේ ගරු නාගරික මන්ත්‍රීතුමන්ලාගේ හා මන්ත්‍රීතුමියන්ගේ ඉල්ලීම් මෙන්ම පොදු මහජනතාවගේ ඉල්ලීම් හා අවශ්‍යතා ඉටු කිරීම සඳහා විශාල ප්‍රශ්න රාශියක් මැද වුව ද ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය කැපවීමෙන් කටයුතු කරන බව ද ගරු නාගරික මන්ත්‍රීවරුන් හා ගරු නාගරික මන්ත්‍රීවරියන් පූර්ණ වශයෙන් හා අඩු වැඩි වශයෙන් ඒ සඳහා දායකත්වය ලබා දෙන බව ද පැවසූ ගරු සභාපතිතුමා, අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු උප සභාපතිතුමා

මන්ත්‍රී මණ්ඩලය ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පලකරමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.2.20ට පමණ අවසන් කරන ලදී.

එම්. ටී. එම්. රුමි,

උප සභාපති,

බළන්ගොඩ නගර සභාව.